# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා

## කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
## ආර්ථිකවිද්‍යාව විෂය හා සම්බන්ධ දේශන මාලා

**ශාස්ත්‍රපති (M.A.)/සමාජීය විද්‍යාපති (M.S.Sc.)**
**පශ්චාත් උපාධි පාඨමාලාව**

**විෂය : ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

**දේශන පැය - 40**

**සැකසුම - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපාලි හෙට්ටිආරච්චි**

**හැඳින්වීම**

ආර්ථිකවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවේ ශාස්ත්‍රපති සහ සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාවන් සඳහා අනිවාර්ය ප්‍රශ්න පත්‍රයක් වන උසස් ආර්ථික න්‍යාය- සාර්ව ආර්ථිකවිද්‍යාව විෂය තුළින් සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම ගැඹුරින් අධ්‍යයනය කරනු ලබයි. සාර්ව ආර්ථිකවිද්‍යාව මඟින් ආර්ථික ක්‍රමයක සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම විග්‍රහ කරන අතර සාර්ව ආර්ථික විචල්‍යයන් ජනතාවට වඩා හිතකර වන ආකාරයට හැසිරවීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳවත් විග්‍රහ කරනු ලබයි. ඒ අනුව සාර්ව ආර්ථිකවිද්‍යාව ගැඹුරින් හැදෑරීම තුළින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය අවබෝධය ලබාගත හැකි අතර මෙම විෂය හැදෑරීම තුළින් පශ්චාත් උපාධි පාඨමාලාවේ අනෙකුත් විෂයන් හැදෑරීම සඳහා අවශ්‍ය පදනම ද සකසා ගත හැකිය.

**පොදු අරමුණු:**

සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් කෙරෙහි අවධානය යොමු කරමින් සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික වශයෙන් පුළුල් දැනුමක් ලබා දීම සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාව පිළිබඳ ඉදිරිපත්ව ඇති න්‍යායාත්මක මතවාද අනුව ප්‍රතිපත්ති තීරණ ගැනීම පිළිබඳ අවබෝධයක් ලබා දීම.

**අන්තර්ගතය:**

හැඳින්වීම, සමහාර ඉල්ලුම සහ සමහාර සැපයුම, සම්භාව්‍ය, කේන්සියානු, නව කේන්සියානු සහ නව සම්භාව්‍ය මාදිලි, ආවෘත සහ විවෘත ආර්ථික ක්‍රමවල පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යභාරය, මූල්‍යවාදය ප්‍රශස්තකරණ මාදිලි ඇතුලුව තාර්කික අපේක්ෂණවාදී ගුරුකුලය, ආර්ථික චක්‍ර පිළිබඳ සමතුලිතතා මාදිලි, උද්ධමනය හා සේවා වියුක්තිය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික ස්ථායීතාවය සහ දිගු කාලීන වර්ධනය සම්බන්ධයෙන් අනුගමනය කරන උපාය මාර්ග.

**ඉගැන්වීමේ ක්‍රමය:**

01. ආධාරක සටහන් ආශ්‍රිතව දේශන පැවැත්වීම
02. දේශන මාතෘකාවලට අදාළ රූප සටහන් සමීකරණ සහ සංඛ්‍යා උදාහරණ යොදා ගනිමින් විෂය කරුණු සාකච්ඡා කිරීම
03. ප්‍රායෝගික තත්ත්වයට විශේෂ අවධානය යොමු කරමින් ප්‍රායෝගික ගැටලු සාකච්ඡා කිරීම
04. පැවරුම් සහ නිබන්ධන සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම

**ඇගයීමේ ක්‍රමය:**

පාඨමාලාව අවසානයේ පවත්නා ලිඛිත පරීක්ෂණය සහ පැවරුම

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය ලකුණු | 80 |
| පැවරුම ලකුණු | 20 |
| මුළු ලකුණු | 100 |

**දේශන මාතෘකා:**

01. හැදින්වීම - සමහාර ඉල්ලුම හා සමහාර සැපයුම
02. සම්භාව්‍ය න්‍යාය
03. කේන්සියානු න්‍යාය
04. මූල්‍යවාදය
05. තාර්කික අපේක්ෂණවාදය
06. සැපයුම් පාර්ශවීය ආර්ථීක න්‍යාය
07. පරිභෝජන න්‍යාය
08. උද්ධමනය හා සේවා වියුක්තිය
09. ත්වරණ මූලධර්මය
10. ව්‍යාපාර චක්‍ර න්‍යාය
11. ආර්ථීක ප්‍රතිපත්ති

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**

# ECON 53025

**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 01

## සමහාර සැපයුම සහ සමහාර ඉල්ලුම

### විශේෂිත අරමුණු.

සාර්ව ආර්ථිකවිද්‍යා විෂයෙ ස්වභාවය, ක්‍රමවේදය සහ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ලබාදීම සහ සාර්ව ආර්ථිකවිද්‍යාව විෂයක් වශයෙන් සංවර්ධනය වී ඇති ආකාරය හඳුනා ගැනීම අපේක්ෂා කෙරේ.

### හැඳින්වීම

ආර්ථික න්‍යායන් ගොඩනැංවීමේ දී සැබෑ ලෝකයෙන් ඉවත් වූ උපකල්පන මත පදනම්වී සාර්ව ආර්ථික ආදර්ශ සහ සූක්ෂම ආර්ථික ආදර්ශ ගොඩනංවනු ලබයි. සාර්ව ආර්ථික ආදර්ශ යනු ආර්ථික ක්‍රමයක සමස්ත ආර්ථික විචල්‍යයන් පිළිබඳ ආදර්ශ ගොඩ නැංවීමයි. සූක්ෂම ආර්ථික ආදර්ශ යනු සමස්ත ආර්ථික විචල්‍යයන් ඉතා කුඩා කොටස්වලට බෙදා එම කුඩා නැත්නම් තනි තනි ආර්ථික විචල්‍යයන් පිළිබඳ ආදර්ශ ගොඩ නැංවීමයි. මෙම ආර්ථික ආදර්ශ ගොඩනැංවීම අනුව ආර්ථික විද්‍යාව සූක්ෂම ආර්ථිකවිද්‍යාව සහ සාර්ව ආර්ථික විද්‍යාව වශයෙන් කොටස් දෙකකට වෙන් කළ හැකිය.

සාර්ව ආර්ථිකවිද්‍යාව මඟින් කරනු ලබන්නේ සාර්ව ආර්ථික ආදර්ශ ගොඩ නංවා ඒවා මත පදනම් වී සැබෑ ලොව සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳව විග්‍රහ කිරීමයි. ඒ අනුව සාර්ව ආර්ථිකවිද්‍යාව තුළ සමහාර සැපයුම, සමහාර ඉල්ලුම, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය, මිල මට්ටම පිළිබඳවත් ගෙවුම් ශේෂය විනිමය අනුපාතිකය පිළිබඳවත් විග්‍රහ කෙරෙන අතර සාර්ව ආර්ථික විද්‍යාව තුළ විශේෂ අවධානය යොමු කොට ඇත්තේ සමහාර සැපයුමේ ස්වභාවය සහ සමහාර ඉල්ලුම තීරණය කරන සාධක එනම් පරිභෝජනය සහ ආයෝජන තීරණය වීමත් ඒ අනුව මිල මට්ටම සහ සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳවය. ඒ හැරුණු විට සමහාර ඉල්ලුම සහ සමහාර සැපයුම පාලනය කිරීම තුළින් ආර්ථික කටයුතු පාලනය කිරීම සඳහා යොදාගත හැකි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳවත් විග්‍රහ කරනු ලබයි.

සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය වඩාත් සංවර්ධනය වනුයේ 1936 දී කේන්සියානු න්‍යාය බිහිවීමත් සමගය. 1930 ගණන් වලට පෙර වැඩි අවධානයක් යොමු කර තිබුණේ සූක්ෂම ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳව විග්‍රහ කිරීමටය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1936 ට පෙර සම්භාව්‍යවාදීන්ට අනුව ආර්ථික ක්‍රමයන් තුළ සාර්ව ආර්ථික ප්‍රශ්න නොතිබීමයි.

සම්භාව්‍යවාදීන්ට අනුව ආර්ථික ක්‍රමයන් නිතරම පූර්ණ සේවා නියුක්ති තත්ත්වයේ පැවති අතර සේවා වියුක්ති ප්‍රශ්න නොමැති විය. එනිසා සම්භාව්‍ය න්‍යාය මූලික වශයෙන් යොමු වී තිබුණේ මිල මට්ටම තීරණය වීම පිළිබඳව විග්‍රහ කිරීමටය. 1936 දී කේන්සියානු න්‍යාය බිහිවීමත් සමග සාර්ව ආර්ථිකවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ පරිවර්තනයක් සිදුවූ අතර කේන්ස් විසින් නිමැවුම සහ සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳ න්‍යායන්ට වැඩි වැදගත් කමක් දෙන ලදි. 1936 න් පසුව සම්භාව්‍ය න්‍යාය බිඳ වැටුණු අතර 1936 සිට 1950 ගණන් මුල් කාලය දක්වා සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළත් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදීත් කේන්සියානු අදහස් පදනම් කර ගන්නා ලදි.

1956 දී සම්භාව්‍ය න්‍යායේ පැවති දුර්වලතා ඉවත් කරමින් කේන්සියානු න්‍යායට විකල්ප න්‍යායක් වශයෙන් මූල්‍යවාදය ඉදිරිපත් විය. 1950 ගණන්වලදී කේන්ස්ගේ සහ කේන්ස්වාදීන්ගේ අදහස් සංශෝධනය කරමින් නව කේන්ස්වාදීන් සහ පශ්චාත් කේන්ස්වාදීන් තම මතවාද ඉදිරිපත් කළ අතර නව සම්භාව්‍යවාදී මූල්‍යවාදය ඉදිරියට ගෙන යමින් තාර්කික අපේක්ෂණවාදය බිහිවිය. 1970 ගණන් අවසානයේ සහ 1980 ගණන් මුල් කාලයේ එතෙක් පැවති ඉල්ලුම් පාර්ශවය අවධාරණය කිරීම වෙනුවට සැපයුම් පාර්ශවය අවධාරණය කරන සැපයුම් පාර්ශවීය ආර්ථික ගුරුකුලය බිහිවිය.

## සමහාර සැපයුම සහ සමහාර ඉල්ලුම

සාර්ව ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ සම්භාව්‍යවාදීන්, කේන්ස්වාදීන්, නව කේන්ස්වාදීන්, මූල්‍යවාදීන්, තාර්කික අපේක්ෂණවාදීන් සහ සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් විසින් විශේෂ අවධානය යොමු කොට ඇත්තේ සමහාර සැපයුම සහ සමහාර ඉල්ලුම පිළිබඳව විග්‍රහ කිරීමටයි.

සම්භාව්‍ය න්‍යායට අනුව සමහාර සැපයුම් ශ්‍රිතය පූර්ණ අනම්‍යව පවතී. ඒ සඳහා හේතු වූයේ සම්භාව්‍යවාදීන් විසින් ආර්ථික ක්‍රමය පූර්ණ සේවා නියුක්ති තත්ත්වයේ පවතින බව සැළකිල්ලට ගත් නිසාය. සම්භාව්‍යවාදීන්ට අනුව සමහාර ඉල්ලුම තීරණය වන ප්‍රධාන සාධක දෙක වූයේ පුද්ගලික පරිභෝජනය සහ පුද්ගලික ආයෝජනයයි. සම්භාව්‍යවාදීන් දැක්වූයේ සමහාර ඉල්ලුමට බලපෑ හැකිවනුයේ මිල මට්ටම කෙරෙහි පමණක් බවයි. කේන්සියානු න්‍යාය තුළ ආර්ථිකය පූර්ණ සේවා නියුක්ති තත්ත්වය කරා ගමන් කරන තෙක් සමහාර සැපයුම් ශ්‍රිතය නම්‍ය වන අතර පූර්ණ සේවා නියුක්ති තත්ත්වයක දී පූර්ණ අනම්‍ය වේ. කේන්ස්ට අනුව සමහාර ඉල්ලුම තුළ පුද්ගලික අංශයේ ඉල්ලුමට අමතරව රාජ්‍ය වියදම් සමහාර ඉල්ලුම තීරණය වන වැදගත් සාධකයක් ලෙස අවධාරණය කර ඇත. ඒ අනුව කේන්ස්වාදීන් සමහාර ඉල්ලුම පාලනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කළ අතර එමගින් සේවා නියුක්තිය වැඩිකර ගත හැකි බව අවධාරණය කරන ලදි.

මූල්‍යවාදීන්, නවකේන්ස්වාදීන්, තාර්කික අපේක්ෂණවාදීන් සහ සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් කේන්සියානු සමහාර සැපයුම් ශ්‍රිතය පිළිගන්නා ලදි. මොවුන් අතර මත භේදය පවතිනුයේ සමහාර ඉල්ලුම තුළ වැදගත් වනුයේ කුමන විචල්‍යයන් ද ඒ අනුව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කළ යුත්තේ කෙසේ ද රජය ආර්ථිකයට මැදිහත් විය යුතු ද? සමහාර ඉල්ලුම වැදගත් ද සමහාර සැපයුම වැදගත් ද යන්න පිළිබඳවය.

**(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)**

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 02

## සම්භාව්‍ය න්‍යාය

**විශේෂිත අරමුණු.**

1936 වනතෙක් සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම සහ බලපෑම පිළිබඳව ආර්ථික විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර තිබූ අදහස් සහ මතවාද පිළිබඳවත් ඒවායේ වලංගුභාවය පිළිබඳවත් ගැඹුරින් අධ්‍යයනය කිරීම.

**හැඳින්වීම**

සම්භාව්‍ය මූල්‍ය න්‍යාය 18 වැනි සියවසේ මැද භාගයේ සිට 1936 දක්වා කාලය තුළ ආර්ථික විද්‍යාඥයින් විසින් පොදුවේ පිළිගනු ලැබූ අදහස් කීපයක් මත ගොඩ නැගී ඇත. සම්භාව්‍ය න්‍යාය තුළ ප්‍රධාන උපකල්පන කීපයක් පදනම් කරගෙන ඇති අතර එම උපකල්පන මගින් සම්භාව්‍ය න්‍යායේ ප්‍රධාන ලක්ෂණ පෙන්නුම් කරයි.

1. ශුද්ධ තරඟකාරී සහ පූර්ණ තරඟකාරී තත්ත්වය සැළකිල්ලට ගැනීම.
2. රාජ්‍ය කටයුතු නොමැති ආවෘත ආර්ථිකයක් සැළකිල්ලට ගැනීම.
3. ලාභ උපරිම කිරීමේ අරමුණ.
4. වැටුප් මට්ටම් සහ මිල මට්ටම් මිල නම්‍යතාවක් පවතින බව.
5. එක් නිෂ්පාදන සාධකයක් පමණක් සැළකිල්ලට ගැනීම.යන තත්ත්වයක් පදනම් කරගෙන ඇත.

**සම්භාව්‍ය මූල්‍ය න්‍යාය**

සම්භාව්‍ය න්‍යාය මූල්‍ය න්‍යාය සහ වටිනාකම් න්‍යාය වශයෙන් එකිනෙකට වෙන් කර තිබුණි. මූල්‍ය න්‍යාය මගින් මුදල් ආර්ථික ක්‍රමයට බලපාන ආකාරයත් වටිනාකම් න්‍යායෙන් භාණ්ඩ වල වටිනාකම තිරණය වීමත් විග්‍රහ කරන ලදි. සම්භාව්‍ය න්‍යායේ මූලික කල්පිතය වූයේ මුදල් භාවිතා කරන ආර්ථික ක්‍රමයක ආර්ථික ක්‍රියාවලිය කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි බවයි.

එනම් :

I. මූර්ත අංශය
II. මූල්‍ය අංශය වශයෙනි

මුදල් හුදෙක් හුවමාරු මාධ්‍යක් පමණි. ඒනිසා එය භාණ්ඩ වල සාපේක්ෂ මිලයන්ට බල නොපෑ යුතු බව සම්භාව්‍යවාදීන් තර්ක කරයි. මුදල් හුදෙක් විනිමය මාධයක් පමණි. ඒ නිසා එය භාණ්ඩ වල සාපේක්ෂ හුවමාරු අනුපාතය කෙරෙහිත් භාණ්ඩ හා සේවා මුළු නිමවුම කෙරෙහිත් බල නොපෑ යුතුය. සාපේක්ෂ මිල ගණන් මූර්ත සාධක මත රඳා පවතින නිසා මුදල් බලපෑ හැක්කේ සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි පමණක් බව සම්භාව්‍යවාදීන් තර්ක කළහ. සම්භාව්‍ය න්‍යාය තුළ දක්නට ලැබුණු මෙම ලක්ෂණය ආර්ථික ක්‍රියාවලිය දෙකඩ කිරීමක් ලෙස හඳුන්වා ඇත. සම්භාව්‍ය න්‍යායේ මෙම දෙකඩ කිරිම කෙතරම් සාර්ථකද මුදල් නිෂ්ක්‍රිය වන්නේ කවර තත්ත්වයක් යටතේද යන්න මුල් කරගෙන පසු කාලයේදී සාකච්ඡාවක් ඇති විය. Oskar Lange සහ Don Patinkin යන දෙදෙනා සම්භාව්‍ය න්‍යාය තුළ මුදල් නිෂ්ක්‍රිය දෙයක් බව පැහැදිලි කළහ.

සම්භාව්‍ය න්‍යාය තුලින් දැක්වුයේ මුදල් ඇතුළු භාණ්ඩ වලට ඇති ඉල්ලුම මුදල් ඇතුළු භාණ්ඩ වල සැපයුමට අනිවාර්යයෙන් සමාන වන බවයි. මෙම අදහස වෝලර්ස් ගේ (WALARS) නීතිය යනුවෙන් හඳුන්වයි. WALARS ගේ නිතියට අමතරව සම්භාව්‍ය න්‍යාය J. B . Say ගේ නීතිය යටතේද පදනම් වී ඇත. මොහු දැක්වුයේ සැපයුම තුළින්ම ඉල්ලුම ජනිත වන බවයි. ඒ නිසා Say ට අනුව භාණ්ඩ වෙළෙඳපොළ අනිවාර්යයෙන් සමතුලිත වේ . Say ගේ නියමය WALARS ගේ නියමයට වඩා ඉදිරියට ගොස් භාණ්ඩ වෙළෙඳපොළ අනිවාර්යයෙන් සමතුලිත වන බව දක්වයි. Say ගේ නියමය තුළින් ගම්‍යවන තවත් කරුණක් වනුයේ ඉල්ලුම් කරන මුදල් ප්‍රමාණය මිල මට්ටමෙන් ස්වාධීනව තිරණය වන අතර එය හැම විටම සපයන මුදල් ප්‍රමාණයට සමාන බවයි. මෙයින් ගම්‍ය වනුයේ මුදල් ප්‍රමාණයේ වෙනසක් තුළින් මිල මට්ටම වෙනස් වුවාට ආර්ථික කටයුතු වලට ( මූර්ත අංශයට) බලපෑමක් ඇති නොවන බවයි. මුදල් වෙළෙඳපොළ හා භාණ්ඩ වෙළෙඳපොල අතර ක්‍රියාකාරිත්වයක් සේගේ නියමය අනුව නැත. ඒ අනුව Osker Lange සහ Patinkin දැක්වුයේ සම්භාව්‍ය න්‍යාය තුළ මිල තිරණය වීමේ ක්‍රියාවලිය දෙකඩ වී ඇති බවයි.

සාපේක්ෂ මිලයන් සහ සේ ගේ නියමය මත රඳන ආර්ථික ක්‍රමයක් මුදල් වලට උපයෝගිතාවක් නැති ආර්ථික ක්‍රමයකි. ඒනිසා මූල්‍ය ආර්ථික ක්‍රමයක් පිළිබඳව කතා කරයි නම් සේගේ නීතිය ප්‍රතික්ෂේප කළ යුතුය. එනිසා Oskar Lange දක්වනුයේ සේගේ නියමය යටතේ කිසිම මූල්‍ය න්‍යායක් ගොඩ නැංවිය නොහැකි බවයි. සේගේ නීතිය පිළිගැනීමෙන් හෝ සම්භාව්‍ය මුදල් ප්‍රමාණවාදය අත්හැර ඒ වෙනුවට වෙනත් න්‍යායන් පිළිගැනීමෙන් හෝ සම්භාව්‍ය න්‍යාය තුළ පවතින පරස්පරතාව ඉවත් කළ නොහැකි බව පැටින්කින් දැක්වීය. ඒ වෙනුවට සම්භාව්‍ය න්‍යායේ සංශෝධනයක් ඇති කිරීමෙන් මෙම පරස්පරතාව ඉවත් කළ හැකි බව පැටින්කින් දැක්වීය.

මූල්‍ය න්‍යාය හා වටිනාකම් න්‍යාය ඒකාබද්ධ කිරීම සඳහා පැටින්කින් යොදාගනු ලැබුවේ මූර්ත ශේෂ ප්‍රතිවිපාකයි. මූර්ත ශේෂ ප්‍රතිවිපාකය හැඳින්වීම තුළින් සම්භාව්‍ය න්‍යායේ දුර්වලතා ඉවත් කළ පැටින්කින් සම්භාව්‍ය න්‍යාය තුළ දක්නට ලැබූ මූලික ලක්ෂණයක් වන මුදලේ නිෂ්ක්‍රීයත්වය ඒ ආකාරයටම ආරක්ෂා කර ගනු ලැබීය.

සම්භාව්‍ය න්‍යාය තුළ මුදල් නිෂ්ක්‍රීය වීම සඳහා කොන්දේසි කීපයක් ඉටුවිය යුතුය.

01. වැටුප් සහ මිල මට්ටම්වල නම්‍යතාවක් පැවතිය යුතුය.
02. මුදල් මායාවක් නොතිබිය යුතුය.
03. ව්‍යාප්ති ප්‍රතිවිපාකයක් නොතිබිය යුතුය.
04. මිල පිළිබඳ අපේක්ෂාවන් අනම්‍ය විය යුතුය.

මෙම කොන්දේසි ඉටුවන තත්ත්වයක් යටතේ සම්භාව්‍ය න්‍යාය තුළ මුදල් නිෂ්ක්‍රීය දෙයක් බව පැටින්කින් පැහැදිලි කර ඇත.

**සම්භාව්‍ය සේවා නියුක්තිය න්‍යාය**

සම්භාව්‍ය න්‍යාය තුළ සේවා නියුක්තිය තීරණය වීම විග්‍රහ කරනුයේ ශ්‍රම වෙළෙඳපොළේ ශ්‍රම ඉල්ලුම ශ්‍රම සැපයුම මතය. සම්භාව්‍ය න්‍යායට අනුව ශ්‍රම වෙළෙඳපොළේ ශ්‍රම ඉල්ලුම විග්‍රහ කරනුයේ හීනවන ආන්තික ඵලදා නියමය මතය. සාධක මිල තීරණය වීම පිළිබඳ හීනවන ආන්තික ඵලදා නියමය අනුව නිෂ්පාදන ආයතනයක් සමතුලිත වීම සඳහා

$MR = MC$ විය යුතුය. ශ්‍රම ඉල්ලුම සම්බන්ධයෙන්
$MR = MRP$ නිසාත්
$MC = W$ නිසාත් ඉල්ලුම් කරන ශ්‍රම ප්‍රමාණය තුලින් ලාභ උපරිම වීමට
$MRP = W$ විය යුතුය
$MRP = MP_L x MR$ වන අතර තරඟකාරී තත්ත්වය යටතේ
$MR = P$ නිසා
$MRP = MP_L \times P$ වේ. ඒ අනුව ශ්‍රම ඉල්ලුම සම්බන්ධයෙන් ලාභ උපරිම වීමට
$MRP = W$ සහ
$MP_L \times P = W$ එනම්
$MPL = W/P$ විය යුතුය.

ඒ අනුව සම්භාව්‍ය න්‍යාය තුළ ශ්‍රම ඉල්ලුම මූර්ත වැටුපේ සෘණ ශ්‍රිතයක් වශයෙන් දක්වා ඇත.

$$D_L = f\ (W/P)$$

සම්භාව්‍ය න්‍යායට අනුව ශ්‍රම සැපයුම මූර්ත වැටුපේ ධන ශ්‍රිතයකි.

$$S_L = f\ (W/P)$$

ශ්‍රම ඉල්ලුම හා සැපයුම මූර්ත වැටුපේ ශ්‍රිතයන් වශයෙන් දක්වමින් ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම මත මූර්ත වැටුප සහ සමතුලිත සේවා නියුක්තිය තීරණය වන බව සම්භාව්‍ය න්‍යායෙන් පෙන්නුම් කරන ලදි. ශ්‍රම වෙළඳපොළේ සේවා වියුක්ති තත්ත්වයක් ඇති නොවන බවත් ශ්‍රම වෙළඳපොළ නිතරම පූර්ණ සේවා නියුක්ති තත්ත්වයක් පවතින බවත් එනිසා ආර්ථික ක්‍රමයක් නිතරම පූර්ණ සේවා නියුක්ති තත්ත්වයේ පවතින බවත් සම්භාව්‍යවාදීන් තර්ක කරන ලදි.

සම්භාව්‍ය න්‍යායතුල පදනම්ව පවතින ප්‍රධානතම නිගමනය වනුයේ ආර්ථික ක්‍රමයක් නිතරම පුර්ණ සේවා නියුක්ති තත්වයේ පවතින බවයි. මෙම අදහස එලවනුයේ සැපයුම තුළින්ම ඉල්ලුම පවතිනවාය යන ජේ.බී. සේගේ නියමය මතය. සේගේ නියමයට අනුව ආර්ථික ක්‍රමයක නිතරම සමස්ත සැපයුම හා ඉල්ලුම එක හා සමාන වේ. මෙම අදහසට පදනම් වනුයේ පොලිය පිළිබඳ සම්භාව්‍ය න්‍යායයි. පොලිය පිළිබඳ සම්භාව්‍ය න්‍යායට අනුව ඉතුරුම් සහ ආයෝජනය යන දෙකම පොළී අනුපාතයේ ශ්‍රිතයන්ය. S = f( r), I = f( r) ඉතුරුම් සහ ආයෝජනය පොළී අනුපාතයේ ශ්‍රිතයක් වශයෙන් දක්වමින් ඉතුරුම් සහ ආයෝජනයේ අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් සමතුලිත පොළී අනුපාතය තීරණය වන බවත් තීරණය වන පොළී අනුපාතය යටතේ නිතරම ඉතුරුම් වලට සමාන පෞද්ගලික ආයෝජනයක් සිදුවන බවත් සම්භාව්‍ය න්‍යායෙන් පෙන්නුම් කරන ලදි. AS = y = C+S නිසාත් AD = NE=C+I නිසාත් සම්භාව්‍ය න්‍යායට අනුව S = I වන නිසා AS = AD වේ. මෙසේ ආර්ථිකය තුළ නිතරම AS = AD වන නිසා තත්ත්වයේ ආර්ථික ක්‍රමය පුර්ණ සේවා නියුක්ති තත්ත්වයට පෙර පවතින බවත් ආර්ථික ක්‍රමයක් තුළ සේවා වියුක්ති තත්ත්වයක් නොපවතින බවත් සම්භාව්‍ය න්‍යායෙන් පෙන්නුම් කරන ලදි .

ඉහත තත්ත්වයන් අනුව සම්භාව්‍ය න්‍යාය පහත සදහන් ශ්‍රිත මත පදනම් ව පවතී.

$$MV = PY$$
$$M = KPY$$
$$D_L = f(W/P)$$
$$\acute{S}L = f(W/p)$$
$$Q = f(L)$$
$$Y = f(L)$$
$$\acute{S} = f(r)$$
$$I = f(r)$$
$$As = AD$$

$$\frac{M}{P} = B$$

**(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)**

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**

# ECON 53025

**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 03

## කේන්සියානු න්‍යාය

**විශේෂිත අරමුණු.**

සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂප කරමින් 1936 දී කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ න්‍යායාත්මක අදහස් සහ ප්‍රතිපත්තිමය විසඳුම් පිළිබඳව පුළුල් දැනුමක් සහ කේන්ස්ගේ අදහස් වල වලංගුභාවය පිළිබඳව කේන්ස්වාදීන් සහ ප්‍රතිවාදීන් ඉදිරිපත් කර ඇති අදහස් හඳුනාගැනීම තුළින් වඩාත් සුදුසු ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම.

**කේන්සියානු න්‍යාය**

1936 දී ජෝන් මෙනාඩ් කේන්ස් (J.M. Keynes) විසින් ප්‍රකාශයට පත්කරන ලද "මුදල් පොළිය සහ සේවා නියුක්තිය පිළිබඳ සාමාන්‍ය න්‍යාය" (The General Theory of Employment Interest and Money) නැමැති කෘතිය මඟින් එතෙක් ආර්ථික න්‍යාය ක්ෂේත්‍රයේ වැදගත් ලෙස සැලකිල්ලට ගනු ලැබූ සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂේප කරමින් ආදායම සහ සේවා නියුක්තිය තීරණය වීම පිළිබඳව නවතම න්‍යායක් ඉදිරිපත් කරන ලදි. මෙම කෘතිය මඟින් කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ අදහස් මූල්‍ය ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රයේ සහ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී ප්‍රධාන වශයෙන්ම පදනම් කරගනු ලැබූ නිසා කේන්ස් විසින් ඉදිරිපත් කරන ලද අදහස් කේන්සියානු විප්ලවයක් වශයෙන් පසුකාලීන ආර්ථික විද්‍යාඥයින් විසින් හඳුන්වා ඇත.

1936 දී කේන්ස් විසින් ඉදිරිපත් කළ ආදායම හා සේවා නියුක්තිය පිළිබඳ න්‍යායේ මූලික අරමුණක් වූයේ ආර්ථික ක්‍රමය නිතරම පූර්ණ සේවා නියුක්ති තත්ත්වයේ පැවතීමට නැඹුරුවක් පවතීය යන සම්භාව්‍යවාදී අදහස ප්‍රතික්ෂප කිරීමත් ආර්ථික ක්‍රමයක් තුළ සේවා වියුක්ති සමතුලිතතාවන් ඇතිවිය හැකිය යන්න පෙන්වා දීමත්ය. සැපයුම තුළින් ඉල්ලුම ජනිතවේය යන සේගේ නියමය ප්‍රතික්ෂප කරන කේන්ස් විසින් සමස්ථ සැපයුම සහ සමස්ථ ඉල්ලුම එක හා සමාන වන අවස්ථාවේදී තීරණය වන සේවා නියුක්ති මට්ටම අනිවාර්යයෙන්ම පූර්ණ සේවා නියුක්ති මට්ටම වීම අවශ්‍ය නොවන බවත් සේවා වියුක්ති තත්වයකදී වුවත් සමස්ථ සැපයුම හා සමස්ථ ඉල්ලුම සමාන විය හැකි බවත් පෙන්නුම් කරන ලදි. සේගේ නියමය ප්‍රතික්ෂේප කිරීමේදී කේන්ස් විසින් පොලිය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂේප කරනු ලබයි. පොළිය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂප කිරීමේදී කේන්ස් විසින් ආයෝජනය පොළී අනුපාතයේ ඍණ ශ්‍රිතයක්ය යන අදහස පිළිගනී. කේන්ස් ප්‍රතික්ෂේප කරනුයේ සම්භාව්‍ය ඉතුරුම් ශ්‍රිතයයි. කේන්ස් දැක්වූ ආකාරයට ඉතුරුම් හා ආයෝජනය තීරණය වනුයේ එකිනෙකට වෙනස් සාධක මතය. ඉතුරුම් ආදායම මත තීරණය වන අතර ආයෝජනය තීරණය වනුයේ පොළී අනුපාතය සහ ලාභ අපේක්ෂාවන් මතය. පොළිය පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂේප කළ කේන්ස් දැක්වූයේ පොළිය මුදල් වෙළෙඳපොලේ මුදලට ඇති ඉල්ලුම හා සැපයුම මත තීරණය වන මූල්‍යමය ප්‍රපංචයක් බවයි.

කේන්ස් විසින් සම්භාව්‍ය න්‍යායේ ශ්‍රම වෙළෙඳපොලේ ඇතිවන සමතුලිතතාව ප්‍රතික්ෂේප කරයි. එහිදී ශ්‍රම ඉල්ලුම මූර්ත වැටුපේ ඍණ ශ්‍රිතයක්ය යන අදහස කේන්ස් පිළිගන්නා අතර ඔහු ප්‍රතික්ෂේප කරනුයේ සම්භාව්‍ය ශ්‍රම සැපයුම් ශ්‍රිතයයි. සම්භාව්‍යවාදීන්ට අනුව ශ්‍රම සැපයුම මූර්ත වැටුපේ ශ්‍රිතයක් වන අතර කේන්ස් දක්වනුයේ ශ්‍රම සැපයුම මූර්ත වැටුපේ ශ්‍රිතයක් නොව මුදල් වැටුපේ ශ්‍රිතයක් බවයි. කේන්ස් දැක්වූයේ ශ්‍රමිකයින් ශ්‍රමය සපයනුයේ මූර්ත වැටුප් පදනම මත නොව මුදල් වැටුප් පදනම මත බවයි. කේන්සියානු න්‍යාය තුළ ශ්‍රම ඉල්ලුම මූර්ත වැටුපේ ඍණ ශ්‍රිතයක් වන අතර ශ්‍රම සැපයුම මුදල් වැටුප මත තීරණය වේ. ශ්‍රම වෙළෙඳපොලේ ශ්‍රම ඉල්ලුම හා ශ්‍රම සැපයුම මත සමතුලිත සේවා නියුක්ති මට්ටම තීරණය වන බව කේන්ස් පෙන්නුම් කළ අතර සේවා වියුක්ති තත්ත්වයකදී වුවත් සමතුලිත සේවා නියුක්තිය තීරණය විය හැකි බව පෙන්නුම් කරන ලදි.

සම්භාව්‍යවාදීන්ගේ මුදල් වැටුප් අඩු කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය විසඳුම ප්‍රතික්ෂප කරන කේන්ස් දැක්වූයේ මුදල් වැටුප් අඩු කළ නොහැකි බවත් මුදල් වැටුප් අඩු කිරීම සේවා වියුක්තියට විසඳුම නොවන බවත්ය. ඒ අනුව කේන්ස් දැක්වූයේ සේවා වියුක්තිය ඉවත් කර ගැනීම සඳහා සමස්ථ ඉල්ලුම වැඩි කළ යුතු බවයි. සමස්ථ ඉල්ලුම වැඩිකළ විට මිල මට්ටම වැඩිවන අතරම නිමැවුම හා සේවා නියුක්තියද වැඩිවන බව කේන්ස් පෙන්නුම් කරන ලදි. සේවා නියුක්තිය තීරණ වීම පිළිබඳව වඩා නිවැරදි න්‍යායක් ඉදිරිපත් කරමින් කේන්ස් දැක්වූයේ ආර්ථික ක්‍රමය තුළ සඵල ඉල්ලුම මත ආදායම සහ සේවා නියුක්තිය තීරණය වන බවයි. සඵල ඉල්ලුම පිළිබඳ මූලධර්මය ඉදිරිපත් කරමින් කේන්ස් විසින් සමස්ථ සැපයුම හා සමස්ථ ඉල්ලුම වශයෙන් සංකල්ප දෙකක් ඉදිරිපත් කරන ලදි. සමස්ථ සැපයුම් ශ්‍රිතය එනම් සමස්ථ සැපයුම් මිල සේවා නියුක්තියේ සහ ආදායමේ ධන ශ්‍රිතයකි. සමස්ථ ඉල්ලුම් ශ්‍රිතය එනම් සමස්ථ ඉල්ලුම් මිල සේවා නියුක්තියේ සහ ආදායමේ ධන ශ්‍රිතයකි. සම්භාව්‍ය න්‍යායට අනුව මෙසේ එකිනෙකට වෙනස් ශ්‍රිත දෙකක් නොපවතින අතර සමස්ථ සැපයුම හා සමස්ථ ඉල්ලුම නිතරම එක හා සමාන වේ. එනම් AS ශ්‍රිතය සහ AD ශ්‍රිතය නිතරම එක මත වැටේ. එසේ වීමට නම් එනම් නිතරම AS=AD වීමට නම් එනම් සේගේ නියමය ඉටුවීමට නම් කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය. එනම්,

1. MPC=1 විය යුතුය.

2. S=I විය යුතුය. මෙම කොන්දේසි දෙකෙන් එකක් හෝ ඉටුවේ නම් සේගේ නියමය ඉටුවේ. සේ විශ්වාසය තැබුවේ දෙවැනි කොන්දේසිය කෙරෙහිය.

කේන්ස් දැක්වූයේ පූර්ණ සේවා නියුක්ති තත්ත්වය විශේෂිත තත්ත්වයක් වන අතර ආර්ථික ක්‍රමයක් තුළ සේවා වියුක්ති සමතුලිතතාවක් ඇතිවිය හැකි බවයි. ඒ අනුව කේන්ස් දැක්වූයේ සඵල ඉල්ලුමේ ඌනතාවයක් නිසා එනම් සමස්ථ ඉල්ලුම අඩු මට්ටමක පැවතීම නිසා සේවා වියුක්ති තත්ත්වයක් ඇති වන බවයි.
පෞද්ගලික ව්‍යවසායී ධනවාදී ආර්ථික ක්‍රමයක සඵල ඉල්ලුමේ ඌණතාවයක් නිසා මතුවන සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා පෞද්ගලික අංශය මැදිහත් වී පෞද්ගලික ආයෝජනය වැඩි කරන බවට සහතික කළ නොහැකි බව කේන්ස් පෙන්නුම් කරන ලදි. එනිසා කේන්ස් දැක්වූයේ සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා රජය ආර්ථික ක්‍රමයට මැදිහත් විය යුතු බවයි. රජය ආර්ථික ක්‍රමයට මැදිහත්වී සඵල ඉල්ලුමේ ඌණතාවය පවතින ප්‍රමාණයෙන් රජයේ වියදම වැඩිකර සමස්ථ ඉල්ලුම වැඩි කළ යුතු බවයි. එසේ රජයේ වියදම් වැඩිකර සමස්ථ ඉල්ලුම වැඩි කළ විට සමස්ථ ඉල්ලුම වැඩිවන ප්‍රමාණයට ගුණක ක්‍රියාවලිය ක්‍රියාත්මක වීම තුළින් සමස්ථ ඉල්ලුම වැඩිවන ප්‍රමාණය මෙන් කිප ගුණයකින් නිමැවුම හා සේවා නියුක්තිය වැඩි කරගැනීම

තුළින් සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගනිමින් ආර්ථික ක්‍රමය පූර්ණ සේවා නියුක්ති තත්ත්වය කරා ළඟා කරගත යුතු බවයි. ඒ අනුව සඵල ඉල්ලුමේ ඌණතාවයක් තුළින් මතුවන සේවා වියුක්ති ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා කේන්ස් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය විසඳුම වනුයේ පිස්කල් ප්‍රතිපත්තිය යටතේ රජයේ වියදම් වැඩි කිරීමේ හිඟ අයවැය ප්‍රතිපත්තියයි.

**කේන්ස්ගේ අදහස් නැවත සළකා බැලීම**

1936 දී කේන්ස් විසින් සාමාන්‍ය න්‍යාය ඉදිරිපත් කිරීමෙන් පසුව වසර කීපයක් එම කෘතිය තුළ අඩංගු සංකල්ප සහ උපකල්පන පිළිබඳවත් ඒවායේ වලංගුභාවය පිළිබඳවත් සාකච්ඡා කිරීමට ආර්ථිකවිද්‍යාඥයින් කීප දෙනෙක්ම යොමු වී සිටියහ. ඉන්පසුව ආර්ථික න්‍යායට සහ ප්‍රතිපත්ති වලට කේන්ස්ගෙන් සිදුවූ සේවය නිසා සමකාලීන ශ්‍රේෂ්ඨතම ආර්ථිකවිද්‍යාඥයා බවට කේන්ස් පත්විය. ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ආර්ථික ප්‍රශ්න හඳුනා ගැනීමේ දී කේන්සියානු අදහස් පදනම් කරගන්නා ලදි. මෙම තත්ත්වය නිසා සම්භාව්‍ය මුදල් ප්‍රමාණවාදී අදහස් සහ මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කළ අය සදහටම අතුරුදහන් වූ බව කේන්ස්වාදීන් විශ්වාස කරන ලදි.

කේන්ස් සහ කේන්ස්වාදීන් අවධාරණය කරනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තිය මඟින් දීර්ඝකාලීන ප්‍රතිඵල ලබා ගැනීමට ප්‍රබල රටවලට පවා නොහැකි විය. ඇමරිකාව සහ බ්‍රිතාන්‍ය යන රටවල් දෙකෙහිම කේන්සියානු අදහස්වල වලංගුභාවය පිළිබඳ ප්‍රශ්න මතුවිය. 1950 ගණන් අවසානයේ දී කේන්සියානු න්‍යායට විකල්ප න්‍යායක් වශයෙන් මූල්‍යවාදය ඉදිරිපත් විය. මූල්‍යවාදීන් කේන්සියානු න්‍යාය සහ ප්‍රතිපත්තිමය විසඳුම ප්‍රතික්ෂේප කරමින් මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කරන ලදි. මෙම තත්ත්වය යටතේ ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය වැනි ප්‍රබල රටවල කේන්සියානු න්‍යාය අපකීර්තියට පත්විය. 1960 ගණන් අවසානයේ දී කේන්ස්ගේ අදහස් සහ කේන්සියානු අදහස් අතර සමානත්වයක් පවතී ද යන සාකච්ඡාවලදී කේන්සියානු ආර්ථිකවිද්‍යාව සහ කේන්ස්ගේ ආර්ථික විද්‍යාව අතර වෙනසක් පවතින බව විවාදයට ලක් විය. (Axel Leijonhufvud) ඇක්සෙල් ලියොන්ෆුඩ් විසින් පෙන්නුම් කරනු ලැබුවේ කේන්ස්වාදීන් විශ්වාස කළ අදහස් බොහෝමයක් කේන්ස් පිළිගත් අදහස් නොවන බවයි. ආර්ථික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කේන්ස් පිළිගත් අදහස් බොහෝ දුරට මුදල්වල වැදගත්කම සහ මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කළ මූල්‍ය වාදීන්ගේ අදහස්වලට ගැලපෙන බව ලියොන්ෆුඩ් පෙන්නුම් කරන ලදි. ආර්ථික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කේන්ස් ඉදිරිපත් කළ අදහස් අලුත් දෙයක් නොවන අතර එම අදහස් 1920 ගණන් වලදී ද සාකච්ඡා කර ඇති බව ද පෙන්නුම් කරන ලදි.

කේන්ස් වාදීන් විසින් කේන්ස්ගේ අදහස් ඉදිරිපත් කර ඇති ආකාරයට කේන්ස්ගේ වැදගත් කම යටපත් වී ඇති බවත් කේන්ස්වාදීන් විසින් කේන්ස්ගේ අදහස් ඉදිරිපත් කරනුයේ IS - LM විග්‍රහය මත පදනම් වීම තුළින් බවත් පෙන්නුම් කරන ලදි. කේන්ස්වාදීන්ගේ අදහස් අනුව කේන්සියානු න්‍යාය සහ සම්භාව්‍ය න්‍යාය අතර පැහැදිලි වෙනසක් නොමැත. කේන්සියානු න්‍යාය පදනම් වී ඇත්තේ මුදල් වැටුප් වෙනස් කළ නොහැකිය යන අදහස මතය. මුදල් වැටුප් වෙනස් කළ හැකි නම් මුදල් වැටුප් අඩුවීම නිසා මුදල් තොගයේ මූර්ත වටිනාකම වැඩිවී පොලී ප්‍රමාණය අඩුවීම තුළින් නිමැවුම සහ සේවා නියුක්තිය වැඩිවිය හැකිය. මිල මට්ටම අඩුවීම නිසා මුදල් වල ක්‍රය ශක්තිය වැඩිවීම තුළින් පුද්ගලයින් සතු ධනය වැඩිවීම තුළින් පරිභෝජන භාණ්ඩ ඉල්ලුම වැඩිවී එමගින් නිමැවුම හා සේවා නියුක්තිය වැඩිවිය හැකි බවයි. මෙම ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු දීමට කේන්ස්වාදීන් අසමත් වී ඇති බව පෙන්නුම් කරයි. නමුත් සැබෑ ලෝකයේ තත්ත්වය සැලකුවිට මුදල් වැටුප් අඩු කළ නොහැකි තත්ත්වයක් හඳුනාගත හැකිය. සැබෑ ලොව ඕනෑම ආර්ථික ක්‍රමයක රජය යම් ප්‍රමාණයකින් හෝ ආර්ථිකයට මැදිහත් වන තත්ත්වයක් හඳුනාගත හැකිය.

කේන්ස්ගේ අදහස් සහ කේන්ස්වාදීන්ගේ අදහස් අතර වෙනසක් පවතින බව පෙන්නුම් කරන ආර්ථික විද්‍යාඥයින් පෙන්නුම් කරනුයේ කේන්ස් පිස්කල් ප්‍රතිපත්තිය මෙන්ම මූල්‍ය ප්‍රතිපත්තිය ද පිළිගෙන තිබූ බවයි. මූල්‍යවාදීන් පිස්කල් ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂප කළත් කේන්ස් විසින් එසේ නොකළ අතර කේන්ස්වාදීන් මූල්‍ය ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂප කරයි. නව කෙන්ස්වාදීන් මැදිහත් අදහස් දරයි. ඔවුන් ආර්ථික අවපාත අවධියක දී පිස්කල් ප්‍රතිපත්තිය අවධාරණය කරන අතර සාමාන්‍ය කාලවලදී ප්‍රතිපත්ති දෙකම යෝග්‍ය බව පවසයි.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 04

## <u>මූල්‍යවාදය</u>

**විශේෂිත අරමුණු.**

කේන්සියානු න්‍යායට විකල්ප න්‍යායක් වශයෙන් මිල්ටන් ෆ්‍රීඩ්මාන් විසින් ඉදිරිපත් කරනු ලැබූ මූල්‍යවාදය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම. සහ කේන්ස් සහ කේන්ස්වාදීන් අතර මතවාද සහ මූල්‍යවාදීන්ගේ මතවාද අතර සංසන්දනයක් තුළින් වඩාත් සුදුසු ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම.

**මූල්‍යවාදය**

1936 කේන්සියානු න්‍යාය බිහිවීමෙන් පසුව මූල්‍ය ආර්ථික විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළත් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දීත් ප්‍රධාන වශයෙන් පදනම් කරගනු ලැබූවේ කේන්සියානු අදහස්ය. නමුත් 1950 ගණන් මුල් කාලය වන විට කේන්සියානු අදහස් වල වලංගුභාවය පිළිබඳ ප්‍රශ්න මතුවිය. මෙම තත්ත්වය යටතේ කේන්සියානු න්‍යායට විකල්ප න්‍යායක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව පැන නැගුණි. මෙම අවශ්‍යතාව මත සම්භාව්‍ය න්‍යායේ පැවති දුර්වලතාවන් ඉවත් කර මුදල් ප්‍රමාණවාදය නව මුදල් ප්‍රමාණවාදය නැත්නම් මූල්‍ය වාදය ලෙසින් නැවත මතු කරන ලදි. 1956 දී M. Friedman විසින් ප්‍රකාශයට පත් කරන ලද Study on the Quantity Theory of Money නැමැති කෘතිය මඟින් මූල්‍ය වාදය ඉදිරිපත් කරන ලදි. සම්භාව්‍ය මුදල් ප්‍රමාණවාදීන් අනුව යමින් මූල්‍යවාදීන් ද ජාතික ආදායම සහ සේවා නියුක්තියත් මිල මට්ටමත් තීරණයේ දීත් ඒවායේ උච්චාවචන පැහැදිලි කිරීමේදීත් මුදල් වල ක්‍රියා කලාපය අවධාරණය කර ඇත. සම්භාව්‍ය මුදල් ප්‍රමාණවාදය ඉදිරිපත් කරනු ලැබූවේ මිල මට්ටම තීරණය වීම පිළිබඳ න්‍යායක් වශයෙන් නොව මුදලට ඇති ඉල්ලුම පිළිබඳ න්‍යායක් වශයෙනි. ෆ්‍රීඩ්මන් විසින් මූල්‍යවාදය මුදලට ඇති ඉල්ලුම පිළිබඳ න්‍යායක් වශයෙන් ඉදිරිපත් කරමින් මූර්ත මුදල් ශේෂ ඉල්ලුම විචල්‍යයන් කීපයක් මත ශ්‍රිතාත්මක සම්බන්ධතාවක් දක්වන බව පෙන්නුම් කරමින් මූර්ත මුදල් ඉල්ලුම සඳහා ඉල්ලුම් ශ්‍රිතයක් ඉදිරිපත් කරන ලදි.

$$m/p = f\,(r_m, r_e, r_b, p^0/p, Y_p, W, U)$$

මෙසේ මුදල් සඳහා ඉල්ලුම් ශ්‍රිතයක් ඉදිරිපත් කරමින් ෆ්‍රීඩ්මාන් විසින් මූල්‍ය වාදයට ප්‍රත්‍යක්ෂ මූලික සාධක ආශ්‍රයෙන් අත්හදා බැලීමේ පදනමක් සපයා දෙන ලදි. මූල්‍ය වාදීන් මූලික වශයෙන් උත්සාහ ගෙන ඇත්තේ මුදල් සැපයුමේ වෙනස අනෙකුත් ආර්ථික විචල්‍යයන්ට බලපාන ආකාරය පැහැදිලි කිරීම සඳහාය.

මුදල් ඉල්ලුම් ශ්‍රිතය ඉදිරිපත් කරමින් මිල්ටන් ෆ්‍රීඩ්මන් ප්‍රමුඛ මූල්‍යවාදීන් දැක්වූයේ මුදල් සැපයුම වැඩි වුවහොත් එම වැඩිවූ මුදල් සැපයුම අක්‍රීය රාශීකරණයට තුඩු නොදී සමස්ථ ආර්ථික කටයුතු වලටම බලපෑම් ඇති කරවන ආකාරයට මුලු ආර්ථිකය පුරා ව්‍යාප්තවී යන බවයි. මුදල් ප්‍රමාණයේ වෙනස්වීමක් වියදම් වෙනස්වීම තුළින් ආදායමට බලපාන යන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බව නව මුදල් ප්‍රමාණවාදීන් දැක්විය. මෙම යන්ත්‍රණය පුද්ගලයින්ගේ වත්කම් ගොනුව හැඩගස්වා ගැනීම හා සම්බන්ධවේ.

මූල්‍යවාදීන්ගේ ප්‍රධාන කල්පිතය වී ඇත්තේ ආර්ථිකයේ කෙටිකාලීන උච්චාවචන මෙන්ම උද්ධමනය හා මිල උච්චාවචනය කෙරෙහිත් මුදල් ඉතා කිට්ටුවෙන් බලපාන බවයි. එනිසා වැදගත් සාධකය වනුයේ මුදල් ප්‍රමාණය මිස පොලී ප්‍රමාණයවත් මුදල් වෙළෙඳපොළ හෝ ණය දීමේ කොන්දේසිවත් නොවන බවයි. මෙම කරුණු අනාවරණය කිරීම නිසා මූල්‍යවාදීන් කේන්ස්වාදීන් ගෙන් වෙනස් වේ.

01. Friedman දැක්වූ ආකාරයට මූල්‍යවාදීන්ගේ ප්‍රධාන නිගමනය වී ඇත්තේ මුදල් ප්‍රමාණයේ වර්ධනය අනුපාතයත් මුදල් ජාතික ආදායමේ වර්ධන අනුපාතයත් අතර එකිනෙකට ගැලපෙන සම්බන්ධයක් පවතින බවයි. ඒ අනුව මුදල් ප්‍රමාණය වේගයෙන් වර්ධනය වුවහොත් මුදල් ජාතික ආදායම ද එලෙසම වර්ධනය වන බව දැක්විය.

02. මුදල් ප්‍රමාණයේ වර්ධනය හා මුදල් ජාතික ආදායමේ වර්ධනය අතර සම්බන්ධය කෙටිකලක් තුළ දී පැහැදිලිව ඉස්මතුව නොපෙනෙන බවයි. මීට හේතුව මුදල් ප්‍රමාණයේ වර්ධනය ආදායමට බලපෑමට කාලයක් ගතවන නිසාය.

03. සාමාන්‍ය වශයෙන් මුදල් ප්‍රමාණයේ වර්ධනයක් මුදල් ආදායමේ වර්ධනයකට මාස 6 - 9 අතර කාලයක් ගනී.

04. මුදල් ප්‍රමාණයේ වර්ධනයත් මුදල් ආදායමේ වර්ධනයත් පළමුව නිමැවුම මත බලපෑම් ඇතිකරයි. මිල මට්ටමට බලපානුයේ පසුවය.

05. සාමාන්‍යයෙන් මිල මට්ටමට බලපෑමක් ඇතිවීමට නිමැවුමට හා මුදල් ආදායමට බලපෑමක් ඇතිවී මාස 9 - 15 අතර කාලයත් ගතවේ. මේ අනුව මුදල් ප්‍රමාණයේ වර්ධනයක් මිල මට්ටමට බලපෑමට මාස 15 - 24 ගත වේ.

ඒ අනුව මුදල් ප්‍රමාණයේ වැඩිවීමක් මාස 15 - 24 අතර දී මිල මට්ටම වැඩිවීමකට හේතුවන අතර මුදල් ප්‍රමාණය අඩුවීමක් මාස 15 - 24 අතර කාලයක දී මිල මට්ටම අඩුවීමකට හේතු වේ. උද්ධමනය කෙටි කාලයක දී පාලනය කළ නොහැකි වන්නේ මේ නිසාය.

06. මේ අනුව උද්ධමනය හැමවිටම මූල්‍යමය සාධකයකි. එය ඇතිවිය හැක්කේ නිමැවුම වර්ධනයට වඩා වැඩි වේගයකින් මුදල් ප්‍රමාණය වර්ධනය වූ විටය. මුදල් ප්‍රමාණයේ වර්ධනයට තුඩු දෙන සාධක රටින් රටට වෙනස් විය හැකිය. එනම් බැංකු ක්‍රමයේ වෙනස්කම්, පුද්ගලික අංශයේ දියුණුව නිසා, රජයේ වියදම් වෙනස්වීම, දේශපාලන වෙනස්වීම, ආර්ථික කටයුතුවල වර්ධනය, පොලිය වෙනස්වීම ආදිය බලපෑ හැකිය.

07. රජයේ වියදම් උද්ධමනකාරී වීමට හෝ නොවීමට පුලුවන. මුදල් මැවීම මගින් රජයේ වියදම් පියවා ගනී නම් එය උද්ධමනකාරී වේ. රජය බදු මගින් හෝ පුද්ගලික අංශයෙන් ගන්නා ණය මගින් වියදම් පියවයි නම් එහි දී වනුයේ පුද්ගලික අංශය වියදම් කිරීමට තිබූ දෙයක් රජය වියදම් කිරීමයි. එය උද්ධමනකාරී නොවේ. මුලු ආදායමින්

කොපමණ ප්‍රමාණයක් රජය වියදම් කළ යුතු ද රජයේ වියදම පිළිබඳ වගකීම කවුරුන් දැරිය යුතු ආදිය තීරණය කිරීමේ දී රාජ්‍ය මූල්‍ය (පිස්කල්) ප්‍රතිපත්තිය ඉතා වැදගත්ය. එහෙත් එය ඒ ආකාරයෙන්ම උද්ධමනය සම්බන්ධයෙන් වැදගත් නොවේ. උද්ධමනයේ දී වැදගත් වනුයේ රජයේ වියදමට මුදල් සපයාගනු ලබන්නේ කෙසේ ද යන්නයි.

08. මුදල් ප්‍රමාණයේ වෙනස්වීම පොළී ප්‍රමාණයට මුලදී එක දිශාවකටත් පසුව ප්‍රතිවිරුද්ධ දිශාවටත් බලපායි. මුදල් ප්‍රමාණයේ වැඩිවීම නිසා මුලදී පොළිය අඩුවේ. නමුත් පසුව මුදල් ප්‍රමාණය වැඩිවීම වියදම් වැඩිවීමට තුඩු දී උද්ධමනය ඇතිවීමත් එනිසා ණය ඉල්ලුම වැඩිවී පොළිය වැඩිවීමකටත් හේතුවේ. ෆ්‍රීඩ්මන් දැක්වූයේ වේගයෙන් මුදල් ප්‍රමාණය වර්ධනය වන රටවල පොළිය ඉහළ බවත් අඩුවෙන් මුදල් ප්‍රමාණය වර්ධනය වන රටවල පොළිය අඩුබවත්ය. එයින් ගම්‍ය වනුයේ මුදල් ප්‍රමාණය වැඩිවීම නිසා පොලිය ද වර්ධනය වන බවයි.

මූල්‍යවාදීන් දක්වා ඇති මෙම නිගමනයන් ඇමරිකාව, ඊශ්‍රායලය, බ්‍රිතාන්‍ය වැනි රටවල ප්‍රායෝගික පරීක්ෂණ වලට භාජනය කර ඇත. ඒවායේ ප්‍රතිඵල සතුටුදායක වී ඇත. M. Friedman සහ David Meiselmain විසින් ඇමෙරිකාවේ 1898 - 1958 දක්වා කාලය තුළ දී දත්ත අනුව කරනු ලැබූ පරීක්ෂණයක ප්‍රතිඵල Relative Stability of Monetary, Velocity and the Investment in the U.S.A 1898 - 1958. යන ප්‍රකාශනයෙන් දක්වා ඇත. මෙම පරීක්ෂණයෙන් කර ඇත්තේ මුදලේ සංසරණ ප්‍රවේගයත් ආදායම් ගුණකයත් යන විචල්‍යයන් දෙකෙහි සාපේක්ෂ ස්ථායීතාවය දිගු කලක් තිස්සේ විමසා බැලීමයි. මෙම පරීක්ෂණයේ ප්‍රතිඵල විශාල මතභේදයකට තුඩු දී ඇත. එම පරීක්ෂණයේ නිගමනය වූයේ මුදලේ සංසරණ ප්‍රවේගය අදායම් ගුණකයට වඩා ස්ථාවර විචල්‍යයක් බවයි. සංසරණ ප්‍රවේගය ස්ථාවර සාධකයක් වීම නිසා මුදල් ප්‍රමාණයේ වෙනස්වීම නිසා මුදල් ආදායම වෙනස් වන්නේ කෙසේ ද කිසා පුරෝකථනය කළ හැක. නමුත් ගුණකය ස්ථාවර නොවීම නිසා ආයෝජනයේ වෙනස්වීමක් ආදායමට බලපාන්නේ කෙසේ ද යන්න පුරෝකථනය කළ නොහැක. මෙම විවාදයේ අවසාන ප්‍රතිඵලය වූයේ මුදල් ප්‍රමාණවාදය විවේචනය කළ අය පවා එය පසුව පිළිගැනීමයි. හේතුව ඕනෑම ආර්ථික න්‍යායක් ඇගයීමේ දී සළකා බැලිය යුත්තේ එම න්‍යායයේ පුරෝකථනය කිරීමේ හැකියාව වීම නිසාය.

## මූල්‍යවාදීන් සහ කේන්ස්වාදීන් අතර සැසඳීමක්

මූල්‍යවාදීන් දක්වනුයේ නිදහස් වෙළෙඳපළ ආර්ථික ක්‍රමයක් ස්වයංපාලනය වීමේ නැඹුරුවක් පවතින බවත් හිතකර වාතාවරණයක් පවත්වා ගනු ලැබේ නම් ආර්ථික ක්‍රමයක් ස්වාභාවික පූර්ණසේවා නියුක්තිය කරාත් සාපේක්ෂව ස්ථායී මිල මට්ටමක් කරාත් නැඹුරු වන බවයි. ලාභ චේතනාවෙන් මෙහෙයවන පුද්ගලික අංශයේ නිෂ්පාදන කටයුතු මඟින් මූර්ත ජාතික ආදායමේ හිතරකර වර්ධනයක් ද ඇතිවේ. මෙම තත්ත්වය යටතේ රජයට කිරීමට සිදුවනුයේ නිදහස් වෙළෙඳපොළ යන්ත්‍රණය කාර්යක්ෂමව පවත්වා ගෙන යෑමට අවශ්‍ය කොන්දේසි පවත්වා ගෙන යෑම පමණි. මුල්‍ය ක්‍රමය පිළිබඳව අයහපත් පාලනයක් නිසා ආර්ථික ක්‍රමය ස්වයංපාලනය වීමේ ලක්ෂණයට බාධාවන් සිදුවිය හැකි අතර එවැන්නක් නිසා අවධමනය සහ උද්ධමනය ඇතිවන බවයි. මේ අනුව මුදල් සැපයුම නිවැරදි ලෙස පාලනය කිරීම රජයේ කාර්යය වේ. එනිසා මූල්‍යවාදීන් දක්වනුයේ ආර්ථික ප්‍රතිපත්තිය මූලිකවම මුල්‍ය ප්‍රතිපත්තිය මත පදනම් විය යුතු බවයි. ඉතා දැඩි අවධමන තත්ත්වයක දී හැරුණු විට රාජ්‍ය මූල්‍ය (පිස්කල්) ප්‍රතිපත්තිය අකාර්යක්ෂම වන බව මූල්‍යවාදීන් දැක්විය.

නමුත් කේන්ස් වාදීන් දක්වනුයේ නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක් ස්වයංක්‍රීයව හැසිරවිය නොහැකි බවයි. එසේ වීමට ඉඩ දුනහොත් දැඩි සේවා වියුක්ති තත්ත්වයක් ඇති වන බවයි. එනිසා රජය ආර්ථික ක්‍රමයට මැදිහත් විය යුතුය. එනිසා පිස්කල් ප්‍රතිප්තිය ප්‍රමුඛ මූල්‍ය ප්‍රතිපත්තිය ඔවුන් අවධාරණය කරයි. ආදායමේ චක්‍රය උච්චාවචනය ඇතිවීමට තුඩු දෙන සාධක පිළිබඳව මූල්‍යවාදීන් සහ කේන්ස් වාදීන් අතර මතභේද ඇත. මූල්‍යවාදීන්ට අනුව ජාතික ආදායමේ උච්චාවචන වලට ප්‍රධාන හේතුව මූල්‍ය සාධකයි.

Friedman දක්වන ආකාරයට මුදල් සැපයුමේ වෙනස්වීම් ආර්ථික කටයුතු වල වෙනසකට හේතු වේ. ඒ අනුව මූල්‍යවාදීන් දක්වනුයේ 1929 ආර්ථික පරිහානිය දැඩි වූයේ මුදල් සැපයුම අඩුවූ නිසා බවයි. 1929 කොටස් වෙළෙඳපොළ බිඳවැටීමත් ව්‍යාපාර කටයුතු පහළ වැටීමත් නිසා මිනිසුන් සල්ලි තබාගැනීමට වැඩි කැමැත්තක් දැක්වූහ. මහ බැංකුවේ උපකාරය නැතිව මෙම සල්ලි ඉල්ලුම සම්පූර්ණ කිරීමට වාණිජ බැංකු අපොහොසත් විය. එනිසා වාණිජ බැංකු වලට තැන්පත් කරුවන්ට මුදල් ගෙවීමට නොහැකි වීම නිසා වාණිජ බැංකු බිඳ වැටුණහ. 1930 දී වාණිජ බැංකු 2000 ක් පමණ තම කටයුතු නතර කරන ලදි. මේ සමඟ බ්‍රිතාන්‍ය, ඇමරිකාව, යුරෝපයේ මූල්‍ය සංකෝචනයක් ඇතිවිය. එය ආර්ථික පරිහානියට හේතු විය. එසේ නොවන්නට එය කෙටිකාලීන අවපාතයක් විය හැකි බව මූල්‍යවාදීන් දක්වයි. චක්‍රීය උච්චාවචනවලට හේතුව මුදල් සැපයුමේ වෙනස බව දක්වන මූල්‍යවාදීන් උද්ධමනයට හේතුව මුදල් සැපයුමේ වැඩිවීම බව දක්වයි. චක්‍රීය උච්චාවචනය පිළිබඳව කේන්ස් වාදීන් ගේ අදහස වනුයේ ව්‍යාපාර චක්‍ර ඇතිවනුයේ ආයෝජනය වෙනස්වීම නිසාය.

මුදල්වල වැදගත්කම පිළිබඳව කේන්ස්වාදීන් එකඟවන ඒකමතික අදහසක් නැත. කෙසේ වෙතත් ආර්ථික උච්චාවචන පැහැදිලි කිරීමේ දී වැදගත් වනුයේ මුදල් පමණක්ය යන අන්තවාදී මූල්‍යවාදීන්ගේ අදහස සියලුම නව කේන්ස්වාදීන් ප්‍රතික්ෂප කරයි. මුදල් සැපයුමේ වෙනස්වීම හා ජාතික ආදායමේ වෙනස්වීම අතර සම්බන්ධය ඔවුන් පිළිගන්නා අතර එම සම්බන්ධය පිළිබඳව හේතුඵල විග්‍රහ කරනුයේ මූල්‍යවාදීන්ට වඩා වෙනස් ආකාරයටය. නව කේන්ස්වාදීන් දක්වන ආකාරයට ජාතික ආදායමේ ඇතිවන වෙනස්කම් මුදල් සැපයුමේ වෙනස් වීම් වලට හේතු වන බවයි. කෙසේ වෙතත් නව කේන්ස්වාදීන් මධ්‍යස්ථය හේතුව ඔවුන් මුදල් වැදගත් නොවන බව දක්වන්නේ නැත. ඔවුන් දක්වනුයේ වේගවත් උද්ධමනය සඳහා මූල්‍ය සාධක මූලික වශයෙන් බලපාන අතර මූල්‍ය නොවන සාධක ද බලපායි. නමුත් මධ්‍යස්ථ ප්‍රමාණයේ උද්ධමනයකට මූල්‍ය නොවන සාධක වැදගත් වන බවත් අලුත් ආයෝජනයන් නිසා උද්ධමන පීඩන ඇති වන බවත් පිරිවැයෙන් තල්ලු වූ උද්ධමන ඇති වන බවත් නව කේන්ස් වාදීන් දක්වයි.

මෙම ප්‍රශ්න විසඳීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති පිළිබඳව ද මත භේද ඇත. මූල්‍යවාදීන් දක්වනුයේ ආර්ථික ක්‍රමයට ප්‍රධාන බලපෑම් මූල්‍ය ප්‍රතිපත්ති මගින් කළ හැකි බවත් පිස්කල් ප්‍රතිපත්තිය අකාර්යක්ෂම බවත්ය. නමුත් නව කේන්ස් වාදීන් මෙම ප්‍රතිපත්තීන් දෙකටම වැදගත්කම දෙන අතර පිස්කල් ප්‍රතිප්තියට වඩා වැඩි වැදගත් කමක් දෙනු ලබයි. මූල්‍ය ප්‍රතිපත්තියේ ශක්තිය හා පිස්කල් ප්‍රතිපත්තියේ දුර්වලතාවයන් පිළිබඳ මූල්‍යවාදීන් ගේ අදහස් මූලික කරුණු 3 ක් මත පදනම්ව ඇත.

01. පොලී ප්‍රමාණය හා මුදලට ඇති ඉල්ලුම අතර සම්බන්ධය
02. පොලී ප්‍රමාණය හා සමස්ත වියදම (ඉල්ලුම) අතර සම්බන්ධය
03. පොලී ප්‍රමාණය හා මුදල් සැපයුම අතර සම්න්ධය යන්න මතය

මූල්‍යවාදීන් ට අනුව මුදලට ඇති ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය ගනුදෙනු චේතනාවයි. එය රඳනුයේ ආදායම මතය. එයට පොලිය බලපානේ නැත. සමපේක්ෂණ චේතනාව යටතේ මුදලට ඇති ඉල්ලුමට පොලිය බලපෑමවත් දැඩි පරිහානි තත්ත්වයක් හරුණුවිට සමපේක්ෂණ චෙතනාව මුදල් ළග තබා ගැනීමට බලපාන්නේ නැත. මුදලට ඇති ඉල්ලුම කෙරෙහි පොලිය එතරම් සංවේදී බවක් නොදක්වන අතර මුදල් සැපයුම කෙරෙහි ද පොලිය වෙනස් වීම සංවේදී බවක් නොදක්වන බවයි. මේ ආකාරයට මුදලට ඇති ඉල්ලුම හා සැපයුම සඳහා පොලී සංවේදීතාව බල නොපාන බව දක්වන මූල්‍යවාදීන් සමස්ත වියදම කෙරෙහි දැඩි පොලී සංවේදීතාවක් පවතින බව දක්වයි. නමුත් නව කේන්ස්වාදීන් දක්වනුයේ මුදලට ඇති ඉල්ලුම හා සැපයුම කෙරෙහි පොලී සංවේදීතාවයක් පවතින අතර සමස්ත වියදම කෙරෙහි පොලී සංවේදීතාවක් නොමැති බවයි. මහ බැංකුව විසින් මුදල් සැපයුම වෙනස් කළ විට පොලිය වෙනස්වීම තුළින් සමස්ත වියදම වෙනස්වන නිසා මූල්‍ය ප්‍රතිපත්තිය කාර්යක්‍ෂම බව මූල්‍යවාදීන් දක්වයි. නමුත් රජය පිස්කල් ප්‍රතිපත්තිය අනුගමනය කළහොත් එය අකාර්යක්‍ෂම වන බව මූල්‍යවාදීන් දක්වයි.

නමුත් නව කේන්ස්වාදීන් දක්වනුයේ මුදලට ඇති ඉල්ලුම හා සැපයුම කෙරෙහි පොලී සංවේදීතාව වැඩි බවත් සමස්ත වියදම කෙරෙහි පොලී සංවේදීතාවක් නොමැති බවත් මුදල් ළග තබා ගැනීම සඳහා සමපේක්ෂණ චේතනාව වැදගත් ලෙස බලපාන බවයි. එනිසා මූල්‍ය ප්‍රතිපත්තිය අකාර්යක්‍ෂමය. නමුත් පිස්කල් ප්‍රතිපත්තිය යටතේ රජයේ වියදම් වැඩිකල විට සමස්ත වියදම වැඩිවී ආදායම ප්‍රසාරණය වේ. මූල්‍යවාදීන්ට වඩා නව කේන්ස්වාදීන් අපක්‍ෂපාතී අදහස් දරයි. මුදල් ආර්ථික ක්‍රමයට බලපාන බවත් එනිසා මූල්‍ය ප්‍රතිපත්තිය පිස්කල් ප්‍රතිපත්තියට අමතරව යොදාගත හැකි ප්‍රතිපත්තියක් බව ඔවුන් දක්වයි. නමුත් නව කේන්ස්වාදීන් වැඩි වැදගත්කම පිස්කල් ප්‍රතිප්තියට දෙනු ලබයි. කෙසේ වෙතත් මූල්‍යවාදීන් සහ නව කෙන්ස්වාදීන් අතර පවතින මෙම මතභේදයන් විසඳී නැත.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 05

## තාර්කික අපේක්ෂණවාදය

**විශේෂිත අරමුණු.**

කේන්ස්වාදීන්ගේ අදහස් සහ මුල්‍යවාදීන්ගේ අදහස් ප්‍රතික්ෂේප කරමින් තාර්කික අපේක්ෂණවාදීන් විසින් ආර්ථිකයේ හැසිරීම සහ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව ඉදිරිපත් කරනු ලැබූ අදහස් පිළිබඳව අවබෝධයක් ලබා දීම.

**තාර්කික අපේක්ෂණවාදය**

1967 දී මිල්ටන් ෆ්‍රීඩ්මන් සහ එඩ්වඩ් පෙල්ප්ස් යන දෙදෙනා විසින් දිගුකාලයේ දී පිලිප්ස් වක්‍රය සිරස් රේඛාවක් වශයෙන් පිහිටනවාය යන අදහස ඉදිරිපත් කිරීමෙන් පසුව එම අදහස බොහෝ ආර්ථික විද්‍යාඥයින් පිළිගන්නා ලදි. නමුත් 1970 ගණන් අවසානය වන විට T.J. Sargent (ටී.ජේ සාජන්ට්) N. Wallacs (නීල් වොලස්), R.E. Lucas (ආර්.ඊ. ලූකස්), සහ R.J. Barro (ආර්.ජේ. බැරෝ) යන අය විසින් පිලිප්ස් වක්‍රය කෙටිකාලයේ දී වුවද සිරස් රේඛාවක් වශයෙන් පවතිනවාය යන අදහස ඉදිරිපත් කරන්නට පටන්ගන්නා ලදි. මොවුන්ගේ අදහස වනුයේ 1970 ගණන් හා 1980 ගණන් වලදී ඇමරිකාව, බ්‍රිතාන්‍යය ඇතුලු ප්‍රධාන රටවල ඇති වූ උද්ධමනය, සේවා වියුක්තිය සහ වෙනත් ආර්ථික ගැටලු විග්‍රහ කිරීම සඳහා කේන්සියානු න්‍යායට සම්පූර්ණ වශයෙන් විකල්ප න්‍යායක් අවශ්‍ය වන බවය. කේන්සියානු න්‍යායට විකල්ප න්‍යායක් වශයෙන් මිල්ටන් ෆ්‍රීඩ්මන් ඉදිරිපත් කරනු ලැබූ මුල්‍යවාදයට වඩා ඉදිරියට යමින් තාර්කික අපේක්ෂණවාදීන් සම්භාව්‍යවාදී අදහස් නැවත මතුකර ඇත. මෙම අදහස් ඉදිරිපත් කරන ඉහතින් දැක්වූ ආර්ථික විද්‍යාඥයන් විසින් ඕනෑම ආර්ථික ක්‍රමයක මිනිසුන්ගේ තාර්කික අපේක්ෂණ මත ආර්ථික විචල්‍යයන් හැසිරීම තීරණය වේය යන අදහස පදනම් කර ගනිමින් ඔවුන්ගේ විග්‍රහය ඉදිරිපත් කරන නිසා මෙම ගුරුකුළයේ ආර්ථික විද්‍යාඥයන් තාර්කික අපේක්ෂණවාදීන් නැත්නම් තාර්කික අපේක්ෂණ ගුරුකුළය වශයෙන් හඳුන්වයි.

තාර්කික අපේක්ෂණවාදීන් සම්භාව්‍ය න්‍යායේ පැවති ලක්ෂණ ඉදිරියට ගෙන යමින් ඔවුන්ගේ විග්‍රහය ගොඩ නංවන අතර මොවුන් දක්වනුයේ මිනිසුන් විසින් තමන් සතුව පවතින දැනුම තර්කානුකූලව ප්‍රයෝජනයට ගන්නා බවයි. මිනිසුන් තමන්ගේ තීරණ ගනු ලබන්නේ තමන්ට ලබාගත හැකි හොඳම දැනුම පදනම් කරගෙනය. එමෙන්ම මිනිසුන් අනාගතය පිළිබඳ තීරණ ගනු ලබන්නේ පවතින අලුත්ම දත්ත හා තොරතුරු පදනම් කරගෙනය. ඒ අනුව මිනිසුන් විසින් අනාගත ආයෝජනය, පරිභෝජනය, ඉතුරුම් ආදිය පිළිබඳව තීරණ ගනු ලබන්නේ තර්කාණුකූල අපේක්ෂාවන් පදනම් කරගෙනය. සාර්ව ආර්ථික ප්‍රතිපත්තියක් පිළිබඳවත් එම ප්‍රතිපත්තියේ ප්‍රතිවිපාක පිළිබඳවත් මිනිසුන්ට දැනුමක් පවතින බවත් එම දැනුමත් පවතින දත්ත හා ආර්ථික න්‍යායන් පිළිබඳව ලබා ගන්නා දැනුමත් පදනම් කර ගනිමින් මිනිසුන් තම තීරණයන් අනාගත අපේක්ෂාවන් පදනම් කරගෙන තර්කාණුකූල තීරණ ගන්නා බව තාර්කික අපේක්ෂණවාදීන් පෙන්නුම් කරයි.

සම්භාව්‍යවාදීන් මෙන්ම තාර්කික අපේක්ෂාණවාදීන් ද මිල ගණන් හා වැටුප් මට්ටම් වල නම්‍යතාවක් පවතින බව සැළකිල්ලට ගනු ලබයි. ඒ අනුව තාර්කික අපේක්ෂණවාදීන් දක්වනුයේ භාණ්ඩ වෙළෙඳපොළ සහ ශ්‍රම වෙළෙඳපොළ නිතරම සමතුලිතව පවතින බවයි. තාර්කික අපේක්ෂණවාදීන්ට අනුව සේවා වියුක්තියක් ඇතිවනුයේ සහ සේවා වියුක්තිය වැඩි වනුයේ පවතින ආර්ථික තත්ත්වය පිළිබඳව ව්‍යාකුලත්වයට පත්වන මිනිසුන් තමන් දැනට කරන රැකියාවලට වඩා හොඳ රැකියා සොයා ගැනීමට දැනට කරන රැකියාවලින් අස්වීමට පටන් ගැනීම නිසා බවයි. තාර්කික අපේක්ෂණවාදීන් දක්වනුයේ පිලිප්ස් වක්‍රය වමේ සිට දකුණට පහළ බසිනුයේ මිනිසුන්ගේ වැරදි අපේක්ෂාවන් නිසා බවයි. ඒ අනුව තාර්කික අපේක්ෂණවාදීන් දක්වනුයේ මිනිසුන් කෙටිකාලයක් තුළදී වුවද තාර්කිකව කටයුතු කරන බවයි. ඔවුන් දක්වන ආකාරයට රජය විසින් පිස්කල් ප්‍රතිපත්තිය යටතේ හෝ මූල්‍ය ප්‍රතිපත්තිය යටතේ ආර්ථිකයට මැදිහත් වී අනුගමනය කරන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වල ප්‍රතිවිපාක පිළිබඳව මිනිසුන්ට පැහැදිලි දැනුමක් සහ අවබෝධයක් පවතී.

කෙටිකාලීන වශයෙන් ද පිලිප්ස් වක්‍රය සිරස් රේඛාවක් වශයෙන් පිහිටන බව තාර්කික අපේක්ෂණවාදීන් පෙන්නුම් කරයි. එනම් රජය පිස්කල් හෝ මූල්‍ය ප්‍රතිපත්ති මඟින් ආර්ථිකයට මැදිහත් වුවහොත් කෙටිකාලීනව ද ඉතා ඉහළ උද්ධමන අනුපාතයක් යටතේ ඉහළ සේවා වියුක්ති තත්ත්වයක් ඇති වන බවයි. එනිසා තාර්කික අපේක්ෂණවාදීන් දක්වනුයේ රජය කිසිම ආකාරයකින් ආර්ථිකයට මැදිහත් නොවිය යුතු බවයි.

නමුත් තාර්කික අපේක්ෂණවාදය වර්තමානයේ ආර්ථික විද්‍යාඥයින් පිළිගන්නේ නැත. වැටුප් හා මිල ගණන් නම්‍යවේය යන තත්ත්වය කිසිසේත්ම සැබෑ ලෝකයට නොගැලපේ. භාණ්ඩ වෙළෙඳපොළවල් සහ ශ්‍රම වෙළෙඳපොළ නිතරම සමතුලිත වේය යන තත්ත්වය සැබෑ ලෝකයට නොගැලපේ. අනෙක් අතට මිනිසුන් නිතරම තාර්කිකව වඩා හොඳ තීරණ ගනු ලබන බවත් පවතින නවතම දත්ත හා න්‍යායන් පිළිබඳ දැනුම මත මිනිසුන් තාර්කික තීරණ ගනු ලබන බවත් යන තාර්කික අපේක්ෂණවාදීන්ගේ අදහස ද බිඳවැටේ. හේතුව එවැනි හැසිරීමක් මිනිසුන්ට පැවතීමට නම් අඩුම වශයෙන් මිනිසුන් පරිගණක යන්ත්‍ර විය යුතුය. ඒ හැරුණු විට තාර්කික අපේක්ෂණවාදීන්ගේ පුරෝකථනය වනුයේ සේවා වියුක්තිය ඉහළ යෑමට හේතුව වනුයේ මිනිසුන් වඩාත් හොඳ රැකියාවන් සොයා ගැනීම සඳහා දැනට කරනු ලබන රැකියාවන්ගෙන් අස්වීම බවයි. මෙයින් ගම්‍ය වනුයේ ඉහළ සේවා වියුක්තියක් පවතින විට රැකියා වලින් අස්වන ප්‍රමාණය ද වැඩිවන බවයි. නමුත් ප්‍රායෝගිකව දැකගත හැකි වනුයේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පවතින විට රැකියා වලින් අස්වන ප්‍රමාණය අඩුවන බවයි. එනිසා තාර්කික අපේක්ෂණවාදීන්ගේ පුරෝකථනය ද බිඳ වැටේ.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 06

# සැපයුම් පාර්ශවීය ආර්ථික න්‍යාය

**විශේෂිත අරමුණු.**

ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම කෙරෙහි ඉල්ලුම් පාර්ශවයට වඩා සැපයුම් පාර්ශවය අවධාරණය කළ සැපයුම් පාර්ශවීය ආර්ථික න්‍යාය තුළින් ඉදිරිපත් කළ අදහස් සහ මතවාද පිළිබඳ අවබෝධයක් ලබා දීම.

**සැපයුම් පාර්ශවීය ආර්ථික න්‍යාය**

1970 ගණන් අවසානයේ සහ 1980 ගණන් මුල් කාලයේ දී ඇමරිකාව සහ එංගලන්තයේ අත්දැකීම් පදනම් කරගෙන මෙම රටවල ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ඉල්ලුම් අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම නිසා දිගුකාලීන වශයෙන් ආර්ථික වර්ධනය සහ සංවර්ධනය අඩාල වීමකට හේතුවන බව තර්ක කරමින් ආර්ථික ප්‍රතිපත්තිය ඉල්ලුම් අංශයට වඩා සැපයුම් අංශය කෙරෙහි අවධානය යොමු කළ යුතු බව තර්ක කරන න්‍යායවාදීන් පිරිසක් බිහිවිය. මෙම න්‍යායවාදීන් සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් වශයෙන් හඳුන්වයි. සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් අතර ආතර් ලැපර්, ජූඩ් වෙනස්කි, නොමන් ට්‍යුආර් පෝල් ක්‍රේග් වැනි අය වැදගත් වේ. මෙම සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින්ට ඇමරිකාවේ ජනාධිපති රේගන්ගේ ආණ්ඩුවත් බ්‍රිතාන්‍යයේ මාග්‍රට් තැචර්ගේ ආණ්ඩුවත් ප්‍රතිපත්තිමය වශයෙන් සහය දක්වන ලදි.

සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින්ගේ ප්‍රධාන තර්කය වනුයේ ආර්ථික ප්‍රතිපත්තිය ඉල්ලුම් අංශය කෙරෙහි යොමුවනවාට වඩා සැපයුම් අංශය කෙරෙහි යොමුවිය යුතු බවයි. එනම් ආර්ථික ප්‍රතිපත්ති තුළින් සමස්ථ ඉල්ලුම වැඩි කරනවාට වඩා සමස්ථ සැපයුම වැඩි කිරීම කෙරෙහි යොමු විය යුතු බවයි. මොවුන්ගේ මෙම තර්කය එතෙක් පැවති ඉල්ලුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින්ගේ එනම් සම්භාව්‍යවාදීන්, කේන්ස්වාදීන් සහ මුල්‍යවාදීන් අදහස් වලට සම්පූර්ණයෙන්ම වෙනස් විය. සම්භාව්‍ය න්‍යාය තුළද ඉල්ලුම් අංශය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර කේන්ස් සහ කේන්ස්වාදීන් දැඩිවම ආර්ථික ප්‍රතිපත්තිය සමස්ථ ඉල්ලුම වැඩි කිරීම කෙරෙහි යොමුවිය යුතු බව දක්වා තිබුනි. මෙම කේන්සියානු අදහස් දිගුකාලයක් තිස්සේ පිළිගන්නා ලදි. කේන්සියානු න්‍යායාට විකල්පයක් වශයෙන් ෆ්‍රීඩ්මන් ප්‍රමුඛ මුල්‍යවාදීන් දැක්වූයේ මුල්‍ය ප්‍රතිපත්තිය යටතේ සමස්ථ ඉල්ලුම පාලනය කිරීම පිළිබඳවය. නමුත් මෙම අදහස්වලට පහර ගැසූ සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් දැක්වූයේ බදු ප්‍රතිපත්තිය යටතේ සමස්ථ සැපයුමට ප්‍රධාන බලපෑමක් කළ හැකි බවයි. බදු ප්‍රතිපත්තිය අවධාරණය කරන සැපයුම් අංශ ගුරුකුළය දක්වනුයේ බදු කපා හැරීම ආර්ථික වර්ධනයකට සහ සංවර්ධනයකට හේතුවන බවයි.

බදූ කපාහැරීම පිළිබඳව වඩාත් අවධාරණය කරන අතර ආතර් ලැපර් දක්වනුයේ බදු අනුපාතිකයන් අඩු කිරීම මගින් රජයේ ආදායම ද වැඩි කර ගත හැකි බවයි. මෙය ලැපර් වක්‍රය මගින් පෙන්නුම් කර ඇත. ලැපර් වක්‍රය මගින් සෘජු බදු අනුපාතය සහ රජයේ ආදායම අතර අතර සම්බන්ධය පෙන්නුම් කරයි. රජයේ බදු අනුපාතය විශාල වශයෙන් වැඩිවීමත් සමග රජයේ ආදායම අඩු වේ. මෙසේ රජයේ බදු අනුපාතය විශාල වශයෙන් වැඩිවීමත් සමග රජයේ බදූ ආදායම අඩුවනුයේ බදු අනුපාතය විශාල වශයෙන් වැඩිවීමත් සමග ශ්‍රමිකයින් අඩුවෙන් වැඩ කිරීමට පෙළඹෙන නිසා බව ආතර් ලැපර්  ප්‍රමුඛ සැපයුම් අංශ අර්ථික විද්‍යාඥයින් පෙන්නුම් කරයි. ශ්‍රමිකයින් ශ්‍රමය සපයන පැය ගණන අඩු කර විවේකය වැඩිපුර ලබා ගැනීමට හෝ වෙනත් සැඟවුණු ආර්ථික කටයුතුවලට යොමුවීම නිසා ශ්‍රමිකයින්ගෙන් නීත්‍යානුකූල ආදායම අඩුවීම තුළින් රජයේ බදු ආදායම අඩුවේ. එනිසා සැපයුම් අංශ ගුරුකුළය පෙන්නුම් කලේ බදු අනුපාතයන් අඩු කල විට මිනිසුන් වැඩිපුර පැය ගණනක් ශ්‍රමය සැපයීමට සූදානම් වීම නිසා ශ්‍රමික ආදායම වැඩි වේ. එවිට අඩු බදු අනුපාතයක් යටතේ වුවත් රජයේ ආදායම වැඩිවන බව ඔවුන් තර්ක කරන ලදි. බදු කපා හැරීම නිසා සමස්ථ ඉල්ලුමට ඇතිවන බලපෑමට වඩා සමස්ථ සැපයුම වැඩිවීමකට හේතුවන බව ඔවුන් තර්ක කරන ලදි. බදු අඩු කිරීම නිසා සපයන ශ්‍රම ප්‍රමාණය වැඩිවන අතර බදු අඩු කිරීම නිසා මිනිසුන් වැඩිපුර ඉතිරිකිරීමට පෙළඹෙන බව සැපයුම් ආංශිකයන් පවසති. බදු අඩු කිරීම නිසා වැඩ කරන පැය ගණන වැඩිවීම තුළින් සමස්ථ සැපයුම වැඩිවීම හේතු වන අතර එනිසාම ආදායම වර්ධනය වී ඉතුරුම් වර්ධනය වන බවත් බදු අඩු කිරීම නිසා වියදම් කළ හැකි ආදායම වැඩි වී ඉතුරුම් වැඩිවන බවත් කර්ක කරන මොවුන් මෙසේ ඉතුරුම් වඩිවී ආයෝජනය වැඩිවීම තුළින්  තවදුරටත් සමස්ථ සැපයුම වැඩිවීමට බලපෑම් ඇති වන බව පෙන්නුම් කරයි. මෙසේ සමස්ථ සැපයුම වැඩිවීම සමස්ථ ඉල්ලුම වැඩිවීමට වඩා බලවත් බව ඔවුන් පෙන්නුම් කරයි.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 07

# පරිභෝජන න්‍යාය

**විශේෂිත අරමුණු.**

ආර්ථික ක්‍රමයක පරිභෝජනයේ හැසිරීම පිළිබඳව කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ න්‍යායාත්මක අදහස් වල පවතින දුර්වලතා පිළිබඳවත් දිගු කාලයේ දී පරිභෝජනය හැසිරෙන ආකාරය පිළිබඳව ඉදිරිපත් වී ඇති අදහස් පිළිබඳවත් පුළුල් අවබෝධයක් ලබාදීම මගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම.

**කේන්සියානු පරිභෝජන ශ්‍රිතය**

කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ $C = a + by$ ආකාරයේ පරිභෝජන ශ්‍රිතය පිළිබඳ සංකල්පය ආර්ථික විද්‍යාඥයෝ සෑහෙන කාලයක් පිළිගත්හ. ජාතික ආදායම පිළිබඳ දත්ත සකස් වෙමින් තිබූ අවදියේ දී මෙම පරිභෝජන ශ්‍රිතය සංඛ්‍යාන විධි ආර්ථික විද්‍යාඥයින්ට ගැළපුණි. මෙම ශ්‍රිතය ගණනය කිරීම පහසු විය. එමෙන්ම ආන්තික පරිභෝජන නැම්යාවේ ප්‍රමාණය ආර්ථික ප්‍රතිපත්ති සකස් කිරීමේ දී වැදගත් විය. කේන්ස් විසින් ඉදිරිපත් කරනු ලැබූ පරිභෝජන ශ්‍රිතයේ සරල සම්බන්ධතාවය පිළිබඳව මුලින්ම කරනු ලැබූ අධ්‍යයනය හරස්කඩ දත්ත සහ කාල ශ්‍රේණි දත්ත පදනම් කරගෙන කරනු ලැබීය. එම ඇස්තමේන්තු කිරීම කේන්සියානු පරිභෝජන ශ්‍රිතය සමඟ හොඳින් ගැළපුණි. කේන්සියානු පරිභෝජන ශ්‍රිතයේ නිවැරදි භාවය අත්හදා බැලිය හැකි තවත් ක්‍රමයක් වූයේ පුරෝකතනය සඳහා එය යොදා ගැනීමට හැකිවීමයි. එනම් ආදායම වැඩිවන විට පරිභෝජනය ද වැඩිවිය යුතු අතර ආදායම හා පරිභෝජනය අතර පරතරය ද වැඩිවිය යුතුය.

පරිභෝජන ශ්‍රිතය පිළිබඳව මුලින්ම කරනු ලැබූ ප්‍රත්‍යක්ෂ මූලික පර්යේෂණය පවුල් අයවැය දත්ත පදනම් කරගෙන කරන ලදි. පසුව ඇමරිකාවේ ජාතික ආදායම් දත්ත සැකසීම ක්‍රමවත් වීමත් සමග කාල ශ්‍රේණි දත්ත ආදියෙන් ද පරිභෝජන ශ්‍රිතය ඇස්තමේන්තු කරන ලදි. 1929 - 1942 අතර කාලයේ ඇමරිකාවේ ජාතික ආදායම් දත්ත සැළකිල්ලට ගෙන ඇස්තමේන්තු කරන ලද පරිභෝජන ශ්‍රිතය $C = 26\frac{1}{2} + \frac{3}{4}Y_d$ වශයෙන් ලැබී ඇත. මෙම පරිභෝජන ශ්‍රිතය මගින් ආදායම හා පරිභෝජනය අතර කිට්ටු සම්බන්ධතාවයක් පවතින බව ගම්‍ය විය. මෙම පරිභෝජන ශ්‍රිතය $C = a + by$ ආකාරයේ කේන්සියානු පරිභෝජන ශ්‍රිතයට ගැලපේ. මෙවැනි පරිභෝජන ශ්‍රිතයක් මඟින් පෙන්නුම් කරන වැදගත් කරුණක් වනුයේ MPC හා APC එකිනෙකින් වෙනස් වන බවයි.

කේන්සියානු පරිභෝජන ශ්‍රිතයේ නිවැරදිභාවය පිළිබඳව දිගින් දිගටම පසුකාලීන ආර්ථික විද්‍යාඥයින් කතා කර ඇත.

**දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය**

1946 දී සයිමන් කුස්නෙට්ස් විසින් 1869 - 1936 දක්වා කාලය තුළ ඇමරිකාවේ ජාතික ආදායම් දත්ත අනුව පරිභෝජන ශ්‍රිතයක් ඇස්තමේන්තු කරන ලදි. ඔහු විසින් ඇස්තමේන්තු කළ පරිභෝජන ශ්‍රිතය අනුව APC වලට ලැබුණු අගයන් වනුයේ 0.84 - 0.89 දක්වාය. එනම් 1869 - 1936 අතර කාලය තුළදී APC ස්ථාවරව පවතින බවයි. එනිසා දිගු කාලයේ දී APC සහ MPC සමානවීමේ උපනතියක් පවතින බවයි. ඔහු ඉදිරිපත් කළ මෙම අදහස් තුළින් කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය සහ දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය වශයෙන් සංකල්ප දෙකක් බිහි විය.

කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතයේ APC ≠ MPC බවත් දිගුකාලීන පරිභෝජන ශ්‍රිතයේ APC = MPC බවත් කුස්නෙට්ස් පෙන්නුම් කරන ලදි. මෙම දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය පිළිබඳ අදහස ඉදිරිපත් වීමත් සමඟ කේන්ස් විසින් ඉදිරිපත් කරන ලද කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතයේ වලංගුභාවය පිළිබඳ තවදුරටත් ප්‍රශ්න මතු විය. කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය දිගුකාලීන පරිභෝජන ශ්‍රිතයෙන් වෙනස් වන්නේ කෙසේ ද යන්න පිළිබඳව විග්‍රහ කිරීමේ දී අදහස් කීපයක් ඉදිරිපත් වී ඇත. කාලයත් සමඟ කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය විතැන්වේය යන අදහස ඉන් එකකි. කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය ඉහළට විතැන් වීම සඳහා බලපාන සාධක කීපයකි.

(01) පාරිභෝගිකයන්ට ලබාගත හැකි ණය ප්‍රමාණය සුලභ වීම. ලබාගත හැකි ණය ප්‍රමාණය වැඩි වීම නිසා ආදායමට වඩා වැඩි පරිභෝජන මට්ටමක් පවත්වා ගත හැකිය.

(02) පුද්ගලයින්ගේ වත්කම් ප්‍රමාණය වැඩිවීම. වත්කම් ප්‍රමාණය වැඩිවීම නිසා ඉහළ පරිභෝජන මට්ටමක් පවත්වා ගනී.

(03) කාලයත් සමග වයස් ව්‍යුහයේ සිදුවන වෙනස්වීම් නිසා පාරිභෝජන මට්ටම වැඩිවේ.

(04) භාණ්ඩ පිළිබඳ අලුත් සොයා ගැනීම් නිසා පරිභෝජන මට්ටම වැඩිවේ.

(05) ආදායම් ව්‍යාප්තියේ සිදුවන වෙනස්වීම් නිසා පාරිභෝජන ශ්‍රිතය විතැන්වේ. ආදායම් සාධාරණව බෙදී යෑම තුළින් පරිභෝජන මට්ටම වැඩිවේ.

(06) සුඛෝපභෝගී භාණ්ඩ කාලයත් සමග අත්‍යවශ්‍ය භාණ්ඩ බවට පත්වීම නිසා පරිභෝජන ශ්‍රිතය විතැන් වේ.

කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය හා දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය අතර සම්බන්ධතාව පැහැදිලි කිරීමේ දී ජේම්ස් ඩුසෙන්බරි (J. Duesenberry) විසින් සාපේක්ෂ ආදායම් කල්පිතය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කර ඇත. $C = a + by$ ආකාරයේ කේන්සියානු පරිභෝජන ශ්‍රිතය නිරපේක්ෂ ආදායම් සංකල්පය මත පදනම් වී ඇති නිසා ඩුසෙන්බරි විසින් එය විවේචනය කරන ලදි.

සයිමන් කුස්නෙට්ස් විසින් දිගුකාලීන දත්ත පරීක්ෂාකරමින් දිගු කාලීනව APC ස්ථාවරව පවතීය වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ අදහස ඩුසෙන්බරි විසින් සාපේක්ෂ ආදායම් කල්පිතය මඟින් ඉදිරිපත් කරන ලදි. ඩුසෙන්බරි දැක්වූ ආකාරයට ඕනෑම සමාජයක

ධනවත් සහ දුප්පත් වශයෙන් පුද්ගලයන් සමාජයේ තමන් දරණ සාපේක්ෂ තත්ත්වය දියුණු කර ගැනීමට සහ එම තත්ත්වය නොවෙනස්ව පවත්වා ගැනීමට උත්සාහ ගනු ලබයි. මෙහිදී තම නිරපේක්ෂ ආදායම කුමන මට්ටමක පැවතුනත් සාපේක්ෂ වශයෙන් ධනවත් පාරිභෝගිකයන් පරිභෝජනය කරන පරිභෝජන මට්ටම අනුගමනය කිරීමට පෙළඹෙන බව ඩුසෙන්බරි දක්වයි. මෙය ප්‍රදර්ශක ප්‍රතිවිපාකයට හසුවීමක් ලෙස හඳුන්වයි. එනම් අනුන්ගේ පරිභෝජන මට්ටමට අනුගමනය කිරීමට පෙළඹීමයි. ඒ අනුව පරිභෝජනය නිරපේක්ෂ ආදායම මත නොව සාපේක්ෂ ආදායම මත රැඳෙන බව ඩුසෙන්බරි දැක්වීය. සාපේක්ෂ ආදායම මත දිගුකාලීනව APC ස්ථාවරව පවතින බව ඔහු දැක්වීය.

දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය පිළිබඳ අදහස ප්‍රැන්කෝ මොඩිග්ලියානි (F. Modigliani) විසින් ජීවන චක්‍ර උපන්‍යාසය මගින් ඉදිරිපත් කරන ලදි. ඔහු දැක්වූයේ මිනිසුන්ගේ ජීවිත කාලය ළමා, තරුණ, මහලු වශයෙන් බෙදූ විට මෙම කාලයන් වලදී ආදායම උච්චාවචනය වුවත් පරිභෝජනය උච්චාවචනය නොවන බවයි. ළමා කාලයේ දී ආදායම් උපයන්නේ නැතිව පරිභෝජනය කරන අතර තරුණ කාලයේ දී ආදායම් උපයා පරිභෝජනය කරන අතර මහලු කාලයේ දී ද ආදායම් උපයන්නේ නැතිව පරිභෝජනය කරන බවයි. ඒ අනුව දිගුකාලයේ දී පරිභෝජනය නොවෙනස්ව පවතින බව මොඩිග්ලියානි පෙන්නුම් කරන ලදි.

කෙටිකාලීන පරිභෝජන ශ්‍රිතය සහ දිගුකාලීන පරිභෝජන ශ්‍රිතය අතර වෙනස පැහැදිලි කිරීමේ දී 1957 දී මිල්ටන් ප්‍රීඩ්මන් විසින් ස්ථාවර ආදායම් කල්පිතය ඉදිරිපත් කරන ලදි. ස්ථාවර ආදායම් කල්පිතය ඉදිරිපත් කරමින් ප්‍රිඩ්මන් විසින් ආදායම හා පරිභෝජනය මනින ආකාරය විවේචනය කරන ලදි. ප්‍රීඩ්මන් දක්වනුයේ ආදායම් හා පරිභෝජනය යන සංකල්ප සඳහා වඩා උචිත නිර්වචනයන් අවශ්‍ය බවයි. ඒ අනුව ප්‍රීඩ්මන් විසින් ස්ථාවර ආදායම යන සංකල්පය ඉදිරිපත් කරන ලදි. මෙම ස්ථාවර ආදායම වර්තමාන ආදායමට වඩා වෙනස්ය. එය එක්තරා සාමාන්‍ය ආදායම් මට්ටමක් පිළිබඳ සංකල්පයකි. පරිභෝජනය පිළිබඳව ඔහු ඉදිරිපත් කලේ පරිභෝජන භාණ්ඩ මිලදී ගැනීම නොව පරිභෝජන භාණ්ඩ පාවිච්චි කරන ප්‍රමාණයයි. ප්‍රීඩ්මන් විසින් වර්තමාන ආදායම කොටස් දෙකකට බෙදයි. එනම් ස්ථාවර ආදායම සහ තාවකාලික නැත්නම් අනපේක්ෂිත ආදායම වශයෙනි. මෙම වෙනස පරිභෝජනයේ ද පවතින බව ඔහු දක්වයි. එනම් ස්ථාවර පරිභෝජනය සහ තාවකාලික පරිභෝජනය වශයෙනි. ඒ අනුව ප්‍රීඩ්මන් විසින් තම පරිභෝජන ශ්‍රිතය සඳහා යොදාගනුයේ ස්ථාවර පරිභෝජන වියදමයි. එය ස්ථාවර ආදායමට සමානුපාතිකව පවතින බව ප්‍රීඩ්මන් විසින් පෙන්නුම් කරන ලදි. මෙවැනි නිරීක්ෂණ තුළින් ප්‍රිඩ්මන් උත්සාහ ගෙන ඇත්තේ පරිභෝජන වියදම වර්තමාන ආදායමට සම්බන්ධ කරනු වෙනුවට ආදායම හා ධනය පිළිබඳ දිගුකාලීන මිණුමකට සම්බන්ධ කිරීමටය. ප්‍රිඩ්මන්ගේ පරිභෝජන ශ්‍රිතය තුළින් පෙන්නුම් කරනුයේ ස්ථාවර පරිභෝජනය ස්ථාවර ආදායමේ ස්ථාවර ශ්‍රිතයක් බවයි. එනම් $C_p = F(Y_p)$ බවයි.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**

# ECON 53025

**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 08

## උද්ධමනය සහ සේවා වියුක්තිය

**විශේෂිත අරමුණු.**

ආර්ථික ක්‍රමයන් තුළ ඇතිවන ප්‍රධානතම ආර්ථික ප්‍රශ්නයන් වන උද්ධමනය හා සේවා වියුක්තිය යන ප්‍රශ්න ඇතිවන ආකාරය සහ එම ආර්ථික ප්‍රශ්ණ අතර පවතින සම්බන්ධතාව පිළිබඳවත් එම ප්‍රශ්න විසඳා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ විට ඇතිවිය හැකි තත්ත්වයන් පිළිබඳවත් න්‍යායාත්මක සහ ප්‍රායෝගික වශයෙන් පුළුල් දැනුමක් ලබාදීම මඟින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය මග පෙන්වීම.

**උද්ධමනය හා සේවා වියුක්තිය**

උද්ධමනය හා සේවා වියුක්තිය පිළිබඳව අදහස් දැක්වූ සම්භාව්‍යවාදීන් පෙන්නුම් කරනු ලැබුවේ ආර්ථික ක්‍රමයක් තුළ උද්ධමනය හා සේවා වියුක්තිය එකවර ඇති නොවන බවයි. සම්භාව්‍යවාදීන්ට අනුව අර්ථ ක්‍රමයක් නිතරම පූර්ණ සේවා නියුක්ති තත්ත්වයේ පැවති අතර ඔවුන්ට අනුව ආර්ථික ක්‍රමය තුළ සේවා වියුක්ති ප්‍රශ්න නොමැති විය. සම්භාව්‍යවාදීන්ට අනුව සේවා වියුක්ති ප්‍රශ්න නොමැති වූ අතර සේවා වියුක්ති තත්ත්වයකදී උද්ධමනයක්ද ඇති නොවේ. උද්ධමනයක් ඇති වනුයේ පූර්ණ සේවා නියුක්ති තත්ත්වයකදී පමණි.

1936 දී කේන්සියානු න්‍යාය බිහි වීමත් සමග සම්භාව්‍ය න්‍යාය බිඳ වැටුණු අතර පූර්ණ සේවා නියුක්ති තත්ත්වය විශේෂිත තත්ත්වයක් වන අතර ආර්ථික ක්‍රමයක් තුළ සේවා වියුක්ති තත්ත්වයක් ඇති විය හැකි බවත් කේන්ස් පෙන්වා දෙන ලදී. කේන්ස් තම න්‍යාය තුළින් උද්ධමනය පිළිබඳව ඉදිරිපත් කරනු ලැබුවේ උද්ධමන පරතරය පිළිබඳ සංකල්පය පමණි. එනම් ආර්ථික ක්‍රමයක් පූර්ණ සේවා නියුක්ති තත්ත්වයට පැමිණියාට පසුව සමස්ථ ඉල්ලුම වැඩිවීමක් නිසා මූර්ත ජාතික නිෂ්පාදිතයේ වැඩිවීමක් සිදු නොවී මුදල් ජාතික ආදායම පමණක් වැඩි වීම නිසා ආර්ථික ක්‍රමය තුළ උද්ධමන පරතරයක් ඇති වන බවයි. පසු කාලයේදී කේන්ස්වාදීන් විසින් උද්ධමන පරතරය පිළිබඳ සංකල්පය ප්‍රයෝජනයට ගනිමින් උද්ධමනය ඇති වන ආකාරය අභිසාරී උද්ධමන ක්‍රියාවලිය සහ අපසාරී උද්ධමන ක්‍රියාවලිය මඟින් පැහැදිලි කරන ලදී.

කේන්ස්වාදීන්ට අනුව උද්ධමනයක් ඇති වනුයේ ආර්ථික ක්‍රමය පූර්ණ සේවා නියුක්ති මට්ටමට පැමිණියාට පසුව පමණි. ඒ අනුව සම්භාව්‍යවාදීන් සහ කේන්ස්වාදීන් දැක්වූ ආකාරයට ඉල්ලුම් උද්ධමනයක් ඇති වනුයේ ආර්ථික ක්‍රමය පූර්ණ සේවා නියුක්ති තත්ත්වයට පැමිණියාට පසුව පමණි. උද්ධමනය පිළිබඳව ඉල්ලුම් න්‍යාය ඉදිරිපත් කරන

සම්භාව්‍යවාදීන් සහ කේන්ස්වාදීන්ට අනුව සේවා වියුක්ති තත්ත්වයකදී උද්ධමනයක් ඇති නොවේ. එනම් සේවා වියුක්තිය සහ උද්ධමනය එකවර ඇති නොවේ. සම්භාව්‍ය න්‍යාය බිඳ වැටීමෙන් පසුව කේන්සියානු න්‍යාය පිළිගත් ප්‍රතිපත්ති සම්පාදකයින් උද්ධමනය සහ සේවා වියුක්තිය එකවර පැවතිය නොහැකි යන කේන්සියානු අදහස ප්‍රතිපත්ති සම්පාදනයේදී වැදගත් ලෙස උපයෝගී කර ගන්නා ලදී.

## පිලිප්ස් වක්‍ර විග්‍රහය

සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී මිල ස්ථායිතා අරමුණත්, සේවා වියුක්ති අරමුණත්, ආර්ථික වර්ධන අරමුණත්, ගෙවුම් ශේෂ සමතුලිත අරමුණත්, ව්‍යාප්ති සාධාරණත්ව අරමුණත් ඕනෑම රටකට වැදගත් වේ. ප්‍රධාන වශයෙන්ම මිල ස්ථායිතාව ආරක්ෂා කර ගන්නා අතර ඉහළ සේවා නියුක්ති මට්ටමක් සහ ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට සෑම රටක්ම කටයුතු කරනු ලබයි. මෙම ආර්ථික අරමුණ ඉටු කර ගැනීම සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී මිල ස්ථායිතා අරමුණ සහ සේවා නියුක්ති අරමුණ අතර ගැටුමක් පවතින බවත් උද්ධමනය සහ සේවා වියුක්තිය එකවර එකවර ඇති විය නොහැකිය යන කේන්සියානු අදහස සනාථ කිරීම සඳහාත් 1958 දී පිලිප්ස් (A.W. Phillips) විසින් බ්‍රිතාන්‍යයේ 1862-1958 අතර කාලයේ මුදල් වැටුප් සහ සේවා වියුක්තිය පිළිබඳ දත්ත සැළකිල්ලට ගෙන වක්‍රයක් නිර්මාණය කරන ලදී. එම වක්‍රය පිලිප්ස් වශයෙන් හඳුන්වනු ලැබේ. පිලිප්ස් වක්‍රය මඟින් පෙන්නුම් කරනුයේ මුදල් වැටුප් වෙනස්වීමේ ප්‍රතිශතයත් සේවා වියුක්ති ප්‍රතිශතයත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බවයි.

පිලිප්ස් වක්‍රය මඟින් පෙන්නුම් කරනු ලැබුවේ සේවා නියුක්තිය වැඩි කර ගැනීමට කටයුතු කරන විට උද්ධමනයක් ඇති වන අතර උද්ධමනය මර්ධනය කර ගැනීමට කටයුතු කරන විට එනම් මිල ස්ථායිතා අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරන විට සේවා වියුක්තිය වැඩිවේ. පිලිප්ස් වක්‍රයෙන් පෙන්නුම් කරන සම්බන්ධතාවය ශ්‍රම වෙළෙඳපොළ ආශ්‍රිතව ද පෙන්නුම් කළ හැක. ශ්‍රම වෙළඳපොළේ වෘත්තීය සමිති පවතින තත්ත්වය යටතේ මුදල් වැටුප් වැඩි වන විට සේවා වියුක්තිය අඩුවේ. එමෙන්ම මුදල් වැටුප් යනු නිෂ්පාදන පිරිවැය තීරණය කරන සාධකයකි. මුදල් වැටුප් වැඩි වන විට නිෂ්පාදන පිරිවැය වැඩිවී මිල වැඩිවේ. ඒ අනුව මුදල් වැටුප් වැඩිවන විට උද්ධමනයක් ඇති වන අතරම සේවා නියුක්තියද වැඩිවේ. එනම් සේවා වියුක්තිය අඩුවේ. එමෙන්ම මුදල් වැටුප් අඩුවුවහොත් ශ්‍රමික ආදායම අඩුවී සමස්ථ ඉල්ලුම අඩුවීම තුළින් නිමැවුම සහ සේවා නියුක්තිය අඩුවේ. එනම් සේවා වියුක්තිය වැඩිවේ. ඒ අනුව මුදල් වැටුප් අඩුවන විට උද්ධමනය අඩුවන අතරම සේවා වියුක්තිය වැඩිවේ.

ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ සාකච්ඡා වලදී පිලිප්ස් වක්‍රය ඉතා හොඳ මඟ පෙන්වීමක් කරන ලදී. ප්‍රතිපත්ති සම්පාදනයේදී ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ තේරීම මත හෝ සමාජ සුභ සාධනය උපරිම වන ආකාරයට පිලිප්ස් වක්‍රයේ සුදුසු ලක්ෂයක් තෝරා ගත හැකි විය. එසේ නැතහොත් පිලිප්ස් වක්‍රයේ සුදුසු ලක්ෂයක් තෝරා ගත යුතු බවට උපදෙස් දීමට හැකි විය. ඒ අනුව 1960 ගණන් වලදී ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී පිලිප්ස් වක්‍රය බෙහෙවින් උපයෝගී කර ගන්නා ලදී. එහිදී උද්ධමන ප්‍රතිශතය ශූන්‍ය වන සේවා වියුක්ති මට්ටම කුමක්ද යන්න සොයා බැලීමට ප්‍රතිපත්ති සම්පාදකයින් උත්සාහ කළ අතර මිල ස්ථායීතාවය හා ගැලපෙන සේවා වියුක්ති මට්ටම ඉතා ඉහළ එකක් බව එහිදී ඔවුන්ට පැහැදිලි විය. ඒ අනුව පූර්ණ සේවා නියුක්ති තත්ත්වය තුළින් ඉතා ඉහළ උද්ධමනයක් ඇති වන බව ඔවුන්ට පැහැදිලි විය.

උද්ධමනය හා සේවා වියුක්තිය අතර කැප කිරීමක් පවතිය යන පිලිප්ස් වක්‍ර සම්බන්ධතාව නව මුදල් ප්‍රමාණවාදීන් එනම් මූල්‍යවාදීන් විවේචනය කරන ලදි. 1970 ගණන් වල මුල් කාලයේදී M. Friedman සහ E. Phalps (එඩ්වඩ් පෙල්ස්) යන දෙදෙනා විසින් පිලිප්ස් වක්‍රය මඟින් පෙන්නුම් කරන සම්බන්ධතාව කෙටි කාලයකට පමණක් අදාළ බවත් එම සම්බන්ධතාව දිගුකාලයේදී පැවතිය නොහැකි බවත් පෙන්නුම් කරන ලදි. මූල්‍යවාදීන් දැක්වූ ආකාරයට මුදල් වැටුප් වෙනස්වීම සහ සේවා වියුක්තිය වෙනස්වීම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතින බව කෙනෙකුට පුරෝකථනය කළ හැකි වුවත් එය පිලිප්ස් වක්‍රය නොවේ. එයින් පිලිප්ස් වක්‍රය ලබා ගැනීමට නම් අපේක්ෂිත උද්ධමනය එනම් අපේක්ෂිත මිල ගණන් වෙනස්වීම එයට ඇතුළත් කළ යුතුය. වෘත්තීය සමිති වැටුප් කේවල් කිරීමේදී අදාල වනුයේ පවතින උද්ධමන අනුපාතය නොව අපේක්ෂිත උද්ධමන අනුපාතය බව මූල්‍යවාදීන් පෙන්නුම් කරයි. එනිසා එසේ අපේක්ෂිත උද්ධමන අනුපාතයන් සඳහා විවිධ පිලිප්ස් වක්‍ර පවතින බව මූල්‍යවාදීන් පෙන්නුම් කරයි. උද්ධමනය හා සේවා වියුක්තිය අතර නිශ්චිත සම්බන්ධතාවයක් දැක්විය නොහැකි බවත් එවැනි සම්බන්ධතාවයක් කෙටි කාලයේදී දැක්විය හැකි වුවත් දිගු කාලයේදී දැක්විය නොහැකි බව මූල්‍යවාදීන් පෙන්නුම් කරයි. දිගු කාලයේදී අපේක්ෂිත උද්ධමන අනුපාතිකයන් වෙනස් වීමත් සමග පිලිප්ස් වක්‍රය විතැන්වීමේදී එහි බෑවුම අඩුවී දිගු කාලයේදී පිලිප්ස් වක්‍රය සිරස් රේඛාවක් වශයෙන් පිහිටන බවද මූල්‍යවාදීන් දැක්වීය.

ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සේවා වියුක්තිය එක්තරා අවම මට්ටමකට වඩා අඩු කිරීමට උත්සාහ කළ විට ඒ තුළින් උද්ධමන ප්‍රවණතා ඇති වන බවත් ඒ තුළින් සේවා වියුක්තිය නැවත වැඩි වන බවත් පෙන්නුම් කරන අතර එක්තරා අවම සේවා වියුක්ති මට්ටමක් පවතින බවත් මූල්‍යවාදීන් ප්‍රකාශ කරයි. මෙම සේවා වියුක්ති මට්ටම ස්වභාවික සේවා වියුක්තිය වශයෙන් හඳුන්වා ඇත. මෙම ස්වභාවික සේවා වියුක්ති මට්ටම අඩු කිරීමට තැත් කළහොත් පෙර පැවති සේවා වියුක්ති මට්ටම පෙරට වඩා උද්ධමනයක් සහිතව ඇති බව ඔහු දැක්වීය. පිලිප්ස් වක්‍රය පිළිබඳව තාර්කික අපේක්ෂණවාදීන් පෙන්නුම් කරනුයේ පිලිප්ස් වක්‍රය කෙටි කාලයේදී පවා සිරස් රේඛාවක් වශයෙන් පිහිටන බවයි. එනම් කෙටි කාලයේදී ඉහළ උද්ධමනයක් යටතේ ඉහළ සේවා වියුක්ති තත්වයක් ඇති විය හැකි බවයි.

**(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)**

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 09

# <u>ත්වරණ මූලධර්මය</u>

**විශේෂිත අරමුණු.**

ආර්ථික ක්‍රමයක ආයෝජනය සහ ජාතික ආදායම අතර පවතින සම්බන්ධතාව පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබා දීම තුලින් ආර්ථිකයක ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම.

**ත්වරණ මූලධර්මය**

ආර්ථික ක්‍රමයක් තුළ ආයෝජනයේ (සමස්ථ ඉල්ලුම) වෙනස්වීම ආදායම කෙරෙහි බලපාන ආකාරය ගුණකය පිළිබඳ මූලධර්මයෙන් පෙන්නුම් කරයි. අනෙක් අතට ආදායමේ ඇතිවන වෙනස්වීම් ආයෝජනය කෙරෙහි බලපාන ආකාරය ත්වරණ මූලධර්මය මගින් පෙන්නුම් කරයි. ඒ අනුව ත්වරණ මූලධර්මය මගින් ආදායම වැඩිවවීම නිසා ආයෝජනය වැඩිවන ආකාරය පෙන්නුම් කරයි. එමෙන්ම ආර්ථික ක්‍රමයක කිසියම් අවස්ථාවක පවතින ප්‍රාග්ධන තොගයත් එම අවස්ථාවේ පවතින ජාතික ආදායමත් අතර නිශ්චිත සම්බන්ධතාවයක් පවතින බවද ත්වරණ මූලධර්මය මගින් පෙන්නුම් කරයි. ප්‍රාග්ධන තොගය සහ නිමැවුම එනම් ජාතික ආදායම අතර පවතින මෙම නිශ්චිත සම්බන්ධතාවය ප්‍රාග්ධන නිමැවුම් අනුපාතය වශයෙන් හඳුන්වනු ලැබේ. ත්වරණ මූලධර්මය මගින් මෙම ප්‍රාග්ධන නිමැවුම් අනුපාතය ස්ථාවරව පවතින බව දක්වයි.

ප්‍රාග්ධන තොගය ජාතික ආදායමේ ශ්‍රිතයකි. එනිසා ප්‍රාග්ධන තොගයට කිසියම් ප්‍රමාණයක් එකතුවීමේ වේගය එනම් ප්‍රාග්ධන තොගයේ වර්ධන වේගය ජාතික ආදායමේ වර්ධන වේගයේ ශ්‍රිතයකි. එනම් ආයෝජනය ජාතික ආදායමේ වර්ධන වේගයේ ශ්‍රිතයකි. ඒ අනුව රටක ශුද්ධ ආයෝජනය ආර්ථික ක්‍රමයක යම් කාල දෙකක් අතරතුරදී ජාතික ආදායම් වැඩිවීමේ කිසියම් ප්‍රතිශතයකි.

$$I_t=(Y_t - Y_{t-1})$$

මෙම තත්ත්වය අනුව ත්වරණ මූලධර්මය මගින් පෙන්නුම් කරනුයේ දෙන ලද ප්‍රාග්ධන නිමැවුම් අනුපාතිකයක් පවතින විට නිමැවුම වැඩි කිරීම සඳහා ප්‍රාග්ධන තොගය වැඩිකළ යුතු බවයි. ප්‍රාග්ධන තොගයට අළුතෙන් එකතු වන ප්‍රමාණය ශුද්ධ ආයෝජනයකි. ඒ අනුව ශුද්ධ ආයෝජනය ජාතික ආදායම වැඩිවන අනුපාතයේ ශ්‍රිතයකි.

නමුත් ආදායමේ සිදුවන වෙනස්වීමක් ආයෝජනය කෙරේ ඇති කරන බලපෑම මෙසේ සරල ලෙස දැක්විය නොහැක. මෙම ත්වරණ මූලධර්මයෙන් පෙන්නුම් කරනුයේ ආයෝජනය තීරණය වනුයේ වර්තමාන ආදායමත් ඊට කලින් පැවති ආදායමත් අතර වෙනස මත බවයි. ආර්ථික ක්‍රමයක් තුළ වර්තමානයේ ආයෝජනය තීරණය වනුයේ $I_t = C_t - C_{t-1}$ අනුවය.

ඒ අනුව t කාලයේ ප්‍රාග්ධන තොගය t කාලයේ ආදායම මත රඳා පැවතිය නොහැකිය. හේතුව t කාලයේ ආයෝජන තීරණ ගන්නා විට t කාලයේ ආදායම පිළිබඳව නොදැන සිටිය හැකිය. ඒ අනුව t කාලයේ ආයෝජනය ඊට ඉහත කාලයේ ආදායම මත තීරණය වේ. ඒ අනුව ඉහත දැක්වූ ත්වරණ සම්බන්ධතාවය වඩා කල්පමාවන් සැළකිල්ට ගනිමින් වෙනස් කර දැක්විය හැකිය. එහිදී t කාලයේ ආයෝජනය ඊට ඉහත කාල පරිච්ඡේද දෙකක ආදායම් සමඟ සම්බන්ධ කර ඇත. මේ මගින් t කාලයේ ආයෝජනය ඊට කලින් කාලයේ ආදායමේ සිදුවූ වෙනස්කමට සම්බන්ධ කර දක්වා ඇත.

$I_t = V(Y_{t-1} - Y_{t-2})$ වේ. මේ අනුව
$Y_{t-1} - Y_{t-2} = \triangle Y_{t-1}$ නිසා ඒ අනුව

$I_t = V(Y_{t-1} - Y_{t-2})$
$I_t = V(\triangle Y_{t-1})$ වේ.

ආර්ථික ක්‍රමයක් තුළ ආයෝජනය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අතර කල්පමාවක් පවතින නිසා යම් කාලයක ආයෝජනය රඳා පවතිනුයේ පසුගිය කාලයේ ආදායමේ සිදුවූ වෙනස්වීම මතය. මෙවැනි කල්පමාවක් සහිත ත්වරණ මූලධර්මය ප්‍රායෝගික තත්ත්වයට වඩාත් ගැලපෙන බව දැකිය හැකිය.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**
**ECON 53025**
**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 10

## <u>ව්‍යාපාර චක්‍ර පිළිබඳ න්‍යාය</u>

**විශේෂිත අරමුණු.**

ආර්ථික ක්‍රමවල ඇති වන චක්‍රීය උච්චාවචනයන් වලට හේතු සහ එම උච්චාවචනයන් තුළින් ඇතිවන ප්‍රතිවිපාක පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබා දීම සහ ආර්ථික ස්ථායීතාවක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවශ්‍ය දැනුම ලබාදීම.

**ව්‍යාපාර චක්‍ර පිළිබඳ න්‍යාය**

ඓතිහාසිකව සළකා බලන විට ධනවාදී ආර්ථික ක්‍රමවල දිගුකාලීන ආර්ථික වර්ධනය සිදුවී ඇත්තේ චක්‍රීය උච්චාවචන සහිත ගමන් මාර්ගයකය. සාපේක්ෂව කෙටි කාලයක් තුළ ආර්ථික ක්‍රමයන් තුළ හටගන්නා අක්‍රමවත් උච්චාවචනයන් සැහෙන කාලයක් තුළ ආර්ථික විද්‍යාඥයන්ට මූලික ප්‍රශ්නයක් වශයෙන් පැවතුනි. ආර්ථික ක්‍රමයක් තුළ හටගන්නා මෙවැනි චක්‍රීය උච්චාවචනයන් වෙළෙඳ චක්‍ර නැතිනම් ව්‍යාපාර චක්‍ර වශයෙන් හඳුන්වයි. මෙම ආර්ථික උච්චාවචනයන් හඳුනාගන්නා විවිධ දර්ශකයන් පවතී. එනම් ජාතික ආදායම, සේවා නියුක්තිය, නිෂ්පාදනය, මිල මට්ටම, ලාභය වැනි දර්ශක වැදගත් වේ. මෙම දර්ශකයන් සැළකිල්ලට ගත් විට එයින් සමහරක් අන් ඒවාට වඩා උච්චාවචනය වේ. මේ නිසා මෙම සියලුම දර්ශක එකවර සැළකිල්ලට ගෙන ඒවායේ හැසිරීම අනුව ව්‍යාපාර චක්‍ර හඳුනා ගැනීම ගැටලු සහගතය. ඒ නිසා වඩා උචිත එක් දර්ශකයක් සැළකිල්ලට ගෙන එහි උච්චාවචන අනුව ව්‍යාපාර චක්‍ර හඳුනා ගැනීම වඩාත් උචිතය. මෙලෙස එක් දර්ශකයක් තෝරා ගැනීමේදී ඒ සඳහා වඩාත් සුදුසු වනුයේ ජාතික ආදායම පිළිබඳ දත්ත භාවිතා කිරීමයි. ඒ අනුව ව්‍යාපාර චක්‍ර මඟින් මූලික වශයෙන් හඳුනාගනු ලබන්නේ පවතින මිල යටතේ ජාතික ආදායමේ උච්චාවචනයන්ය. ඒ අනුව ව්‍යාපාර චක්‍රයක මූලික අවධි 4ක් හඳුනා ගත හැකිය.

1. ආර්ථිකයේ පසු බැසීම
2. ආර්ථික පරිහානි අවස්ථාව (අවපාත)
3. ආර්ථිකයේ ප්‍රසාරණ අවස්ථාව
4. උත්පාත අවස්ථාව

මෙම එක් එක් අවස්ථාවලදී ආර්ථික ක්‍රමය තුළ වෙනස් වෙනස් ආර්ථික ලක්ෂණ දක්නට ලැබේ. ආර්ථික ක්‍රමයේ පසුබසින අවස්ථාවේදී ජාතික ආදායම, නිෂ්පාදනය, සේවා නියුක්තිය, මිල මට්ටම, ලාභය ආදිය පහත බැසීමට පටන් ගනී. ප්‍රසාරණ අවස්ථාවේදී මේවා ඉහළ නැගීමට පටන් ගනී. අවපාත අවස්ථාවේදී මෙම ආර්ථික විචල්‍යයන් ඉතා පහත් තත්වයට පහත වැටෙන අතර උත්පාත අවස්ථාවේදී ඉතා ඉහළ මට්ටමකට ඉහළ නගී.

ව්‍යාපාර චක්‍ර පිළිබඳ සම්භාව්‍ය න්‍යායේ විවිධත්වයක් දක්නට ලැබේ. සම්භාව්‍ය න්‍යායේ චක්‍ර පිළිබඳ ප්‍රධාන අදහස් තුනක් පවතී. එනම්, 1. මූල්‍ය ඉල්ලුම් න්‍යාය, 2. මූල්‍ය නොවන ඉල්ලුම් න්‍යාය, 3. සැපයුම් න්‍යාය වශයෙනි. මූල්‍ය ඉල්ලුම් න්‍යායෙන් දැක්වූයේ පොලී ප්‍රමාණයේ උච්චාවචන නිසා ණය මුදල් සැපයුමේ උච්චාවචනයන් සිදුවී ආයෝජනයෙහි උච්චාවචනයන් තුළින් ජාතික ආදායමේ උච්චාවචනයන් එනම් ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි. මූල්‍ය නොවන ඉල්ලුම් න්‍යායෙන් දැක්වූයේ ප්‍රග්ධන තොගය සහ සමස්ත ඉල්ලුම අතර එකිනෙකට නොගැලපෙන සම්බන්ධතාවන් හට ගනීම තුළින් ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි. සැපයුම් න්‍යාය මගින් දැක්වූයේ නිෂ්පාදන පිරිවැය සහ ලාභවල උච්චාවචන නිසා ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි. මෙම අදහස් වලට අමතරව ව්‍යාපාර චක්‍ර පිළිබඳව සම්භාව්‍යවාදීන් තවත් අදහස් කීපයක් ඉදිරිපත් කර ඇත. ඒ අතර ඌණ පරිභෝජන න්‍යාය මගින් දැක්වූයේ ආදායමින් වැඩි කොටසක් පිරිමැසුම්දායීව භාවිතා කරන පුද්ගලයින් වෙතට ගලායෑම නිසා ආයෝජනය අඩුවී ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි. ඒ හැරුණු විට අධි ආයෝජන න්‍යාය මගින් දැක්වූයේ උවමනාවට වඩා ආයෝජනය වැඩිවීම නිසා ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි. සූර්ය ලප න්‍යාය මගින් දැක්වූයේ දේශගුණය වෙනස්වීම නිසා ව්‍යාපාර චක්‍ර ඇතිවන බවයි.

කේන්ස් විසින් තම න්‍යාය මගින් මූලික වශයෙන් උත්සාහ ගනු ලැබුවේ පූර්ණ සේවා නියුක්ති තත්ත්වය විශේෂිත තත්ත්වයක් බවත් සේවා වියුක්ති තත්ත්වයකදී වුවත් ආර්ථික ක්‍රමයේ සමතුලිත ජාතික ආදායම තීරණය විය හැකි බව පෙන්වා දීමටය. ඔහු විසින් ව්‍යාපාර චක්‍ර පිළිබඳ සාකච්ඡා කිරීමට එතරම් උත්සාහ ගෙන නැත. ව්‍යාපාර චක්‍ර පිළිබඳ කේන්ස්ගේ සාමාන්‍ය න්‍යායේ එක් පරිච්ඡේදයක් ඇතුලත් කර ඇති අතර එමගින් දක්වා ඇත්තේ ව්‍යාපාරික අපේක්ෂාවන් වෙනස් වීම නිසා MEC (ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාවය) වෙනස්වීම තුළින් ආයෝජනය වෙනස් වී ආදායම හා පරිභෝජනය වෙනස්වීම නිසා ව්‍යාපාර චක්‍ර ඇතිවිය හැකි බවයි. නමුත් ව්‍යාපාර චක්‍ර වලට තුඩු දෙන හේතු පිළිබඳ නිවැරදි විග්‍රහයක් කේන්ස් විසින් දැක්වූයේ නැත. නමුත් කේන්සියානු න්‍යාය ඉදිරිපත් වීමෙන් පසුව ව්‍යාපාර චක්‍ර පිළිබඳ වඩාත් න්‍යායාත්මක ආකෘති කීපයක් බිහිවූ අතර ඒවා කේන්සියානු විග්‍රහය පදනම් කරගෙන බිහිවූ ඒවාය.

**ව්‍යාපාර චක්‍ර පිළිබඳ සැමුවෙල්සන් ආකෘතිය**

1939 දී සැමුවෙල්සන් විසින් ගුණකය හා ත්වරණයේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය තුළින් ව්‍යාපාර චක්‍ර ඇතිවන බව පෙන්වා දෙන ලදි. කේන්සියානු න්‍යාය බිහිවීමට පෙර ව්‍යාපාර චක්‍ර පිළිබඳ පැවැති ජනප්‍රිය න්‍යාය වූයේ ත්වරණ මූලධර්මයයි. සැමුවෙල්සන් විසින් කේන්සියානු න්‍යාය එයට එකතුකරන ලදි. මීට පෙර ව්‍යාපාර චක්‍රවල පරිවර්තන ස්ථාන පැහැදිළි කිරීම සඳහා බාහිර විචල්‍යයන්ගේ බලපෑම සැලකිල්ලට ගත් නමුත් සැමුවෙල්සන් විසින් ප්‍රථම වරට පරිවර්තන ස්ථාන ආර්ථික ක්‍රමයේ හැසිරීම තුළින් පැහැදිලි කරන ලදි. ත්වරණ මූලධර්මය මගින් පෙන්නුම් කරනුයේ ජාතික ආදායමේ වෙනස්වීම ආයෝජනයට බලපාන බවයි. ගුණක සම්බන්ධතාවය මෙසේ දැක්විය හැකිය.

$$Y_t = I_t \left( \frac{1}{MPS} \right)$$ සහ

$$Y_t = V(Y_t - Y_{t-1}) \left( \frac{1}{MPS} \right)$$ වේ.

$$Y_t = \left( \frac{V}{V - MPS} \right) Y_{t-1} \text{ වේ}$$

මෙම සමීකරණය මගින් Y විචල්‍යයේ වටිනාකම ඊට කලින් කාලයේ Y වල වටිනාකමේ ශ්‍රිතයක් වශයෙන් ප්‍රකාශකර ඇත. $Y_t$ වල අගය $Y_{t-1}$ වටිනාකම මත තීරණය වන බව පෙන්නුම් කරන නිසා මෙම සමීකරණය මගින් එක් කල් පමාවක් පමණක් සැලකිල්ලට ගෙන ඇත. ඉහත දැක්වූ ලෙසට ගුණකය සහ ත්වරණය මූලධර්මය ඒකාබද්ධ කල විට ව්‍යාපාර චක්‍ර පිළිබඳ පැහැදිලි කිරීමක් සිදුවන්නේ නැත. ඒ අනුව පෙන්නුම් කරනුයේ ආදායම අස්ථාවර වන බව පමණි. කල්පමාවන් සහිත ත්වරණ විග්‍රහය ප්‍රායෝගික තත්ත්වයට ගැලපෙන අතර එය මගින් චක්‍රීය උච්චාවචන පැහැදිලි කල හැකිය.

$$Y_t = I_t \left( \frac{1}{MPS} \right) \text{ සහ}$$

$I_t = V(Y_{t-1} - Y_{t-2})$ අනුව

$$Y_t = \frac{V}{MPS} (Y_{t-1} - Y_{t-2}) \text{ වේ.}$$

මෙහි V සහ MPS ස්ථාවරව පවතිනබව සැලකිල්ලට ගෙන ඇත. මෙම කල්පමා විග්‍රහය යටතේ දෙයාකාරයක චක්‍රීය උච්චාවචන සිදුවිය හැකිය. 1. අභිසාරී උච්චාවචන සහ 2. අපසාරී උච්චාවචන වශයෙනි. අභිසාරී උච්චාවචන යටතේ ආදායමේ චක්‍රීය උච්චාවචන කාලයත් සමඟ ඉවත්වී යයි. අපසාරී උච්චාවචනය යටතේ ආදායමේ උච්චාවචන කාලයත් සමඟ දිගින් දිගටම වැඩි වී යයි. මෙයින් අභිසාරී උච්චාවචන ස්ථායී සමතුලිතතාවක් පෙන්නුම් කරන අතර අපසාරී උච්චාවචන මගින් අස්ථායී සමතුලිතතාවක් පෙන්වයි. මෙයින් කවර ආකාරයේ උච්චාවචන ඇතිවේද යන්න තීරණය වනුයේ V සහ MPS වල අගයන් මතය.

### ව්‍යාපාර චක්‍ර පිළිබඳ කැල්ඩෝර් ආකෘතිය N. Kaldor

සැමුවෙල්සන්ගේ විග්‍රහයේ පැවති දුර්වලතා ඉවත් කිරීම සඳහා පසු කාලයේ නොයෙක් විග්‍රහයන් ඉදිරිපත් වූ අතර කැල්ඩොර්ගේ විග්‍රහය ඉන් එකකි. කැල්ඩෝර්ගේ විග්‍රහය තුළ C=f(y) සහ S=f(y) ලෙස සැළකිල්ලට ගෙන ඇත. එමෙන්ම ආයෝජන තොග සකස් කිරීමේ මූලධර්මය මත පදනම් විය. මෙම කැල්ඩෝර්ගේ විග්‍රහයේ ප්‍රධානම නවතාවය වනුයේ පරිභෝජනය, ඉතුරුම් සහ ආයෝජන රේඛීය නොවන ශ්‍රිතයන් ලෙස සැළකිල්ලට ගැනීමයි. මෙම තත්ත්වය පසුකාලීන න්‍යායන් සඳහාද පදනම් කරගෙන ඇත. මෙම කැල්ඩෝර්ගේ ආකෘතිය ඉදිරිපත් කිරීමේදී ස්ථායී සහ අස්ථායී සමතුලිතතා සඳහා කොන්දේසි ඉදිරිපත් කර ඇත. ස්ථායී සමතුලිතය සඳහා අවශ්‍ය කොන්දේසි වනුයේ ආන්තික ආයෝජන නැමියාව =MPI ආන්තික ඉතුරුම් නැමියාවට (MPS) වඩා අඩුවීමයි. (MPI<MPS) අස්ථායී සමතුලිතයට අවශ්‍ය කොන්දේසිය වනුයේ MPI > MPS වීමයි.

කෙසේ වෙතත් මෙම තත්ත්වයන් දෙක යටතේ ව්‍යාපාර චක්‍ර ඇති නොවන නමුත් සැබෑ ලොව නියත වශයෙන්ම ව්‍යාපාර චක්‍ර ඇතිවන බව කැල්ඩෝර් දක්වයි. I සහ S ශ්‍රිතයන් රේඛීය නොවුනත් එක් ප්‍රදේශයකදී MPI>MPS විය හැකි අතර තවත් ප්‍රදේශයකදී MPI<MPS විය හැකිය. එසේ වූ විට ජාතික ආදායම උච්චාවචනය විය හැකිය. එනම් ජාතික ආදායමේ බහු විධ සමතුලිතතාවක් ඇතිවිය හැකිය. මෙම බහුවිධි සමතුලිතතාවන් ගෙන් පෙන්නුම් කරනුයේ චක්‍රීය උච්චාවචනයන්ය. එනම් ව්‍යාපාර චක්‍රයන්ය.

I සහ S ශ්‍රිතයන් රේඛීය නොවන තත්ත්වයක් ගත හැක්කේ කෙසේද යන්න කැල්ඩෝර් පැහැදිලි කරයි. මෙම විග්‍රහය තුළ දක්වා ඇති ඉතුරුම් හා ආයෝජන ශ්‍රිතයන් කෙටිකාලයකට අදාල වේ. දිගු කාලයේදී ඒවා විතැන් විය හැකිය. චක්‍ර දෙකම එකවර විතැන්වීමක් අවශ්‍යයෙන්ම සිදුවිය යුතු නැත. එක් චක්‍රයක් ස්ථාවරව තිබියදී අනෙක් චක්‍රය විතැන් විය හැකිය. ආර්ථික ක්‍රමයන් තුළ ඇතිවන උච්චාවචන සඳහා එක සමාන කාලයක් ගතවීම අවශ්‍ය නැත. එමෙන්ම සංකෝචනය සහ ප්‍රසාරණය වීම එක සමාන වීමද අවශ්‍ය නැත. ඒවා තීරණය වනුයේ S සහ I චක්‍රවල බෑවුමත් ඒවා විතැන් වන ප්‍රමාණයත් මතය. මේ ආකාරයට කැල්ඩෝර් විසින් ඉදිරිපත් කරනු ලැබූ වෙළෙඳ චක්‍ර පිළිබඳ න්‍යාය වෙළෙඳ චක්‍ර පිළිබඳ න්‍යායන්ගේ වර්ධනය සඳහා මනා පදනමක් සකස් කර ඇති බව දැක්විය හැකිය.

**වෙළඳ චක්‍ර පිළිබද හික්ස්ගේ න්‍යාය**

J.R. Hicks විසින් 1950 දී ලියන ලද The Contribution Theory of the Trade Cycle නැමැති කෘතියේ ඔහුගේ අදහස ඉදිරිපත් කර ඇත. වෙළෙඳ චක්‍ර පිළිබඳ හික්ස් න්‍යාය සඳහා සැමුවෙල්සන්ගේ ගුණකය සහ ත්වරණයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අදහසත් Harrod-Dormar වෘද්ධි ආකෘතියත් බලපා ඇත. ඒ අනුව හික්ස්ගේ න්‍යාය ප්‍රධාන වශයෙන් ආර්ථික වෘද්ධිය සහ සමතුලිතතාවන්ගේ ගමන් මාර්ගය සාකච්ඡා කිරීමට යොමුවී ඇත. හික්ස්ගේ න්‍යාය තුළ අන්තර්ගතව පවතින විග්‍රහ උපකරණ වනුයේ පාරිභෝජන ශ්‍රිතය, පෙළඹවූ ආයෝජන ශ්‍රිතය, ත්වරණ විග්‍රහය, ස්වාධීන ආයෝජනය ආදියයි. එමෙන්ම හික්ස්ගේ විග්‍රහය තුළ විපරිවර්තන ස්ථාන තීරණය වීමෙහිලා ඉහළ සීමාවන් සහ පහළ සීමාවන් වශයෙන් සංකල්ප දෙකක් ඇතුළත් කර ඇත. හික්ස්ගේ පරිභෝජන ශ්‍රිතයේ පරිභෝජන සහ ආදායම අතර කල්පමාවක් පවතින බව දක්වමින් සලකා බලන කාලයේ පරිභෝජනය ඊට කලින් කාලයේ ආදායමට සම්බන්ධ කර ඇත. ඊට හේතු වශයෙන් ඔහු දක්වනුයේ (1) ආදායම් ලැබීම සහ වියදම් කිරීම අතර කාල පරතරයක් පැවතීම (2) පොලී, බදුකුලී, සහ ලාභ යන වැටුප් නොවන පුද්ගලික ආදායම් වල සිදුවන වෙනස ජාතික ආදායම වෙනස් වීමත් සමග ක්ෂණිකව පිළිබිඹු නොවීම නිසා බවයි. හික්ස්ගේ ආයෝජන ශ්‍රිතයේ කොටස් දෙකක් ඇත. එනම් පෙළඹවූ ආයෝජනය සහ ස්වාධීන ආයෝජනය වශයෙනි. මෙයින් පෙළඹවූ ආයෝජනය ත්වරණ මූලධර්මය පදනම් කරගෙන විග්‍රහ කරනු ලබයි. ත්වරණ සම්බන්ධතාවය රේඛීය නොවන සම්බන්ධතාවයක් පෙන්වයි. මෙහිදී ආයෝජන වෙනස් වනුයේ ආදායම වෙනස් වන ප්‍රමාණයට සමානුපාතිකව නොවේ.

හික්ස්ගේ විග්‍රහය අනුව ආදායම ඉහළ ගිය හැකි උපරිම සීමාවනුයේ ශ්‍රමය පූර්ණ සේවා නියුක්ති තත්වයට පත්වීමයි. මෙම පදනම යටතේ ආදායමේ චක්‍රීය ගමන් මාර්ගය පැහැදිලි කර ගත හැකිය. එහිදී ස්වාධීන හේතු නිසා සිදුවන ස්වාධීන ආයෝජනයේ වැඩිවීමක් සැළකූ විට එය සමාන වේගයකින් දිගුකාලයක් තිස්සේ වර්ධනය වේ. හික්ස් විසින් ඉහළ සීමාවන් හා පහළ සීමාවන් යන සංකල්ප භාවිතා කරමින් වෙළෙඳ චක්‍රයේ විපරිවර්තන ස්ථාන පැහැදිලි කරන ලදි. මෙහිදී ආදායමේ ඉහළ සීමාව වශයෙන් පූර්ණ

සේවා නියුක්ති තත්ත්වයක් ආදායමේ පහළ සීමාව වශයෙන් දළ ආයෝජනය ශූන්‍ය තත්ත්වයට පත්වීම සහ ස්වාධීන ආයෝජනය අඛණ්ඩව සිදුවන තත්ත්වයක් හික්ස් විසින් පෙන්නුම් කර ඇත. න්‍යායාත්මකව පෙන්නුම් කරන තත්වයක් හැරුණුවිට සැබෑ ලෝකයේ ව්‍යාපාර චක්‍ර ඇතිවීම සඳහා දේශපාලන වෙනස්වීම, දේශගුණික වෙනස්වීම, ස්වාභාවික විපත්, කැරලි කෝලහල, යුද්ධ වැනි බාහිර සාධක ද බලපානු ලබයි.

(විද්‍යාර්ථීන් අතර බෙදා හැරීම සඳහා)

**ආර්ථිකවිද්‍යා අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**
**ශාස්ත්‍රපති/සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව**

# ECON 53025

**උසස් ආර්ථික න්‍යාය - සාර්ව ආර්ථිකවිද්‍යාව**

පත්‍රිකා අංක 11

## ආර්ථික ප්‍රතිපත්තිය

**විශේෂිත අරමුණු.**

ආර්ථික විචල්‍යයන් ජනතාවට වඩා හිතකර වන ආකාරයට හැසිරවීම සඳහා අනුගමනය කළ හැකි ප්‍රතිපත්ති පිළිබඳවත් එම ප්‍රතිපත්ති වල කාර්යක්ෂමතාවය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුමක් ලබා දීම මඟින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන දැනුම ලබා දීම.

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති**

ආර්ථික ප්‍රතිපත්ති යනු ආර්ථිකයක ආර්ථික විචල්‍යයන් ජනතාවට වඩා හිතකර වන ආකාරයට හැසිරවීම තුළින් ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා අනුගමනය කරන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ය. ආර්ථික විචල්‍යයන් ජනතාවට වඩා හිතකර වන ආකාරයට හැසිරවීම තුළින් සමාජ සුභසාධනයක් අත්කර ගත හැකි නිසා ආර්ථික ප්‍රතිපත්ති යනු ආර්ථික විද්‍යාවේ ප්‍රමාණාත්මක අංශයයි. එනිසා අර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂා කරනුයේ සමාජ සුභසාධනය උපරිම කිරීමයි. එනිසා ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම රටක රජයට අයත් කාර්යයක් වේ.

ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ තීරණ ගැනීමේ දී ජනතාවගේත්, නිලධාරීන්ගේ සහ රාජ්‍ය පාලකයනගේත් අදහස් සම්බන්ධ කර ගනිමින් තීරණ ගත යුතුය. එසේ නොමැතිව නිළධාරීන්ගේ අදහස් මත පමණක්ම හෝ රාජ්‍ය පාලකයාගේ අදහස් මත පමණක් ප්‍රතිපත්ති තීරණ ගනු ලැබුවහොත් රට අභ්‍යන්තරයේ අවුල් සහගත තත්ත්වයන් ඇතිවිය හැකිය. ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් අත්කර ගැනීමට අපේක්ෂිත ආර්ථික අරමුණු කීපයකි. එනම් පූර්ණ සේවා නියුක්ති අරමුණ, මිල ස්ථායීතාවයක් අත්කර ගැනීම, ආර්ථික වර්ධන අරමුණ, ව්‍යාප්ති සාධාරණත්ව අරමුණ, ගෙවුම් ශේෂ සමතුලිත හා අරමුණ, ප්‍රාදේශීය සමබර වර්ධන අරමුණ යන අරමුණු වැදගත් වේ. මෙම සාර්ව ආර්ථික අරමුණ ඉටුකර ගැනීම සාර්ව ආර්ථික ස්ථායීතාවක් අත්කර ගැනීමකි.

මෙම ඕනෑම සාර්ව ආර්ථික අරමුණු දෙකක් අතර අන්‍යෝන්‍ය ගැටුමක් පවතී. එනම් එක් අරමුණක් ඉටුකර ගැනීමට කටයුතු කිරීමේ දී තවත් අරමුණක් ඉටුකර ගැනීමට නොහැකිවේ. එනිසා සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී සාර්ව ආර්ථික අරමුණු අතර පවතින ගැටුම සමතයකට පවත්වන ආකාරයට එනම් ආර්ථික ස්ථායීතාවක් අත්කර ගත හැකි ආකාරයට ආර්ථික ප්‍රතිපත්තිවල සැලසුම් ක්‍රියාත්මක කළ යුතුය. ඕනෑම රටක ක්‍රියාත්මක කළ හැකි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කීපයකි.

1. රාජ්‍ය මූල්‍ය (පිස්කල්) ප්‍රතිපත්තිය
2. මහබැංකු මූල්‍ය ප්‍රතිපත්තිය
3. විනිමය පාලන ප්‍රතිපත්තිය
4. මිල සහ ආදායම් පාලන ප්‍රතිපත්තිය
5. ප්‍රකාශන ප්‍රතිපත්තිය යන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ හැකි අතර සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාවය පිළිබඳව ආර්ථික විද්‍යාඥයින් අතර මතභේද පවතී.

ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වඩාත් වැදගත් වනුයේ පිස්කල් ප්‍රතිපත්තිය සහ මූල්‍ය ප්‍රතිපත්තියයි. සම්භාව්‍යවාදීන් මුදල්වල ක්‍රියාකලාපය සහ මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කළ අතර සම්භාව්‍ය න්‍යාය ප්‍රතික්ෂප කරමින් කේන්ස් විසින් ආර්ථික කටයුතු පාලනය කිරීමේ ලා පිස්කල් ප්‍රතිපත්තිය යටතේ හිඟ අයවැය ප්‍රතිපත්තිය අවධාරණය කරන ලදි. මූල්‍යවාදීන් විසින් නිමැවුම, මිල මට්ටම සහ සේවා නියුක්තිය පාලනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය අවධාරණය කරයි. පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාව පිළිබඳ අදහස් දක්වන කේන්ස්වාදීන් දක්වනුයේ ආයෝජනයට ඇති පොලී නම්‍යතාවය අඩු නිසා MEC වක්‍රය වැඩි බෑවුම් සහිතව පිහිටන නිසා IS වක්‍රය වැඩි බෑවුම් සහිතව පිහිටන අතර මුදලට ඇති ඉල්ලුම් පොලී නම්‍යතාවය අඩු නිසා LM වක්‍රය අඩු බෑවුම් සහිතව පිහිටන බවයි. මෙම තත්ත්වය යටතේ පිස්කල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම බවත් මූල්‍ය ප්‍රතිපත්තිය අකාර්යක්ෂම බවත් කේන්ස්වාදීන් පෙන්නුම් කරයි.

මූල්‍යවාදීන් දක්වනුයේ ආයෝජනයට ඇති පොලී නම්‍යතාව වැඩි නිසා MEC වක්‍රය අඩු බෑවුම් සහිතව පිහිටන අතර එනිසා IS වක්‍රය අඩු බෑවුම් සහිතව පිහිටන අතර මුදලට ඇති පොලී නම්‍යතාව අඩු නිසා LM වක්‍රය වැඩි බෑවුම් සහිතවත් පිහිටන නිසා මූල්‍ය ප්‍රතිපත්තිය කාර්යක්ෂම වන අතර පිස්කල් ප්‍රතිපත්තිය අකාර්යක්ෂම බවයි. පිස්කල් සහ මූල්‍ය ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතා හඳුනා ගැනීමේ දී LM වක්‍රයේ පිහිටීම වැදගත් වේ. LM වක්‍රයේ පිහිටීම අනුව අවධි තුනක් හඳුනාගත හැකිය. එනම්, 1. කේන්ස්වාදී ප්‍රදේශය, 2. අතරමැදි ප්‍රදේශය, 3. මූල්‍යවාදී ප්‍රදේශය වශයෙනි. කේන්ස්වාදී ප්‍රදේශය තුළ ද්‍රවශීලතාපාෂය පවතින නිසා කේන්ස්වාදී ප්‍රදේශය තුළ පිස්කල් ප්‍රතිපත්තිය කාර්යක්ෂම වන අතර මූල්‍ය ප්‍රතිපත්තිය අකාර්යක්ෂම වේ. මූල්‍යවාදී ප්‍රදේශය තුළ මුදලට ඇති පොලී නම්‍යතාව අඩු නිසා LM වක්‍රය අනම්‍යව පිහිටයි. එනිසා මූල්‍යවාදී ප්‍රදේශය තුළ පිස්කල් ප්‍රතිපත්තිය අකාර්යක්ෂම වන අතර මූල්‍ය ප්‍රතිපත්තිය කාර්යක්ෂ වේ. අතරමැදි ප්‍රදේශය තුළ ප්‍රතිපත්ති දෙකම කාර්යක්ෂම වේ.

කේන්ස්වාදීන් සහ මූල්‍යවාදීන් ආර්ථික ප්‍රතිපත්ති මඟින් සමස්ථ ඉල්ලුමට බලපෑම් කළ යුතු බව පෙන්නුම් කරන අතර සැපයුම් පාර්ශවීය ආර්ථික විද්‍යාඥයින් පෙන්නුම් කරනුයේ ආර්ථික ප්‍රතිපත්ති මඟින් සමස්ත සැපයුමට බලපෑම් කළ යුතු බවයි. කේන්ස්වාදීන් පෙන්නුම් කරනුයේ රජය ආර්ථික ක්‍රමයට මැදිහත් විය යුතු බවයි. නමුත් මූල්‍යවාදීන් පෙන්නුම් කරනුයේ රජය විසින් පුද්ගලික අංශයට අවශ්‍ය හිතකර වාතාවරණය සකස් කර දිය යුතු බවයි. නමුත් තාර්කික අපේක්ෂණවාදීන් දක්වනුයේ රජය කිසිසේත්ම ආර්ථිකයට මැදිහත් නොවිය යුතු බවයි.

**පරිශීලනය සඳහා සුදුසු ග්‍රන්ථ.**


Ahuja, H.L. (2004) Macroeconomics: Theory and Policy, S. Chand and Co. Ltd. New Delhi.

Ackley, G., (1978), Macroeconomics: Theory and Policy, Macmillan, London.

Crotty, J.R. (1980), Post-Keynesian Economic Theory, American Economic Review, 1980 May.

Culbertson, J.M. (1968), Macroeconomics: Theroy and Stabilization Policy, McGraw-Hill.

Duesenberey, J.S. (1949), Income Savings and the Theory of the Consumer Behaviour, Harward University Press.

Friedman, M. (1959), Studies in the Quantity Theory of Money, Princeton University Press.

Friedman, M. (1957), Theory of the Consumption Function, Princeton University Press.

Hicks, J.R. (1932), The Theory of Wages, Macmillan, London

Harvey, Jack, (1998), Modern Economics, Seventh Edition, Macmillan, London

Keynes, J.M., (1936), The General Theory of Employment Interest and Money, Harcourt Breau, Jovanovich.

Kumar, N. and Mittal, R. (2002), Monetary Economics, Annual Publications, New Delhi.

Sapiro, E. (1982), Macroeconomic Analysis, Harcourt Brace, Jovanovich.

Surgent, T.J. and Wallace, N. (1976), Rational Expectations and the Theory of Economic Policy, Journal of Monetary Economics, April 1976.

Sethi, T.T. (1985), Monetary Economics, S. Chand and Co. Ltd. New Delhi

Stonier, A.W. and Hague, D.C. (1975), A. textbook of Economic Theory, Fourth Edition, Longman Group Ltd., London.

Tobin, J. (1957), Money Trade and Economic Growth, Macmillan, London.

Tobin, J. (1980), Contemporary Macroeconomic Theory, University of Chicago Press.

Vaish, M.C. (2005), Macroeconomic Theory, Vikas Publication, New Delhi.

Vaish, M.C. (2004), Monetary Theory, Vikas Publication, New Delhi.

සපිරෝ එඩ්වඩ්, (19994 සහ 1996), සාර්ව ආර්ථික විශ්ලේෂණය, පස්වැනි සංස්කරණය, පළමු වෙළුම සහ දෙවන වෙළුම, පරිවර්තනය, ආර්ථිකවිද්‍යා අංශය, කොළඹ විශ්වවිද්‍යාලය.

හෙට්ටිආරච්චි උපාලි, (2005), ජාතික ආදායම න්‍යාය සහ භාවිතය, කතෘ ප්‍රකාශණ, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.